


# Sinhala Lyrics Collection

## Volume 1

**100 songs**

Compiled By

Chandra B. Gamlath

St. Louis, Missouri

USA

2004

# Table of Contents

001 - අන්න බලන් සඳ - කුණ්ඩලකේශි ... 5
002 - ප්‍රේමයෙන් මන රංජිත වේ - මනමේ ... 6
003 - දී කිරි දී කිරි - රතු හැට්ටකාරි ... 7
004 - දැක්කොත් පද්මාවතී - පද්මාවතී ... 8
005 - සත් සියක් කපු මල් රැගෙන මම - කුවේණි ... 9
006 - සාන්ත ජෝන්ගෙ වීදියේ කඩේ - බැලසන්ත ... 10
007 - හරිම් රජ සැපා - දුටුගැමුණු ... 11
008 - මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ - විධුර ජාතකය ... 12
009 - කවාලා විළඳ ජාතී - රොඩී කෙල්ල ... 13
010 - ලෝනා මුණි රාජගේ - හේමමාලි ... 14
011 - අඹ දඹ නාරන් - රාමායණය ... 15
012 - දන්න වං හුං - ශ්‍රී වික්‍රම ... 16
013 - ඇස ප්‍රීති කරන රූපා - මානාභරණ ... 17
014 - ආරණෙඋ ඉන්නා - සිවම්මා ධනපාල ... 18
015 - ආලෙ බැන්ද - දික්තල කාලගෝල ... 19
016 - ඇන්නෑවෙ මේ මළ කෝලං - දික්තල කාලගෝල ... 20
017 - රතදර සිරියා පරදන - දික්තල කාලගෝල ... 21
018 - අද වෙස්සන්තර රාජ පුතා - වෙස්සන්තර ජාතකය ... 22
019 - සිරි සංඝ බෝධි - සිරිසඟබෝ ... 23
020 - ගම්බිර තෙදැති - බැලසන්ත ... 24
021 - මොරොට්ටු ගම්මන - ?? ... 25
022 - සීතා මා ශ්‍රීයා ඉන්නේ - රාමායණය ... 26
023 - පත්මේකි සේම මූණා - රාමායණය ... 27
024 - ඇයි තරහෙන් - රත්නාවලී නාටකය ... 28
025 - දන්නො බුදූන්ගෙ - සිරිසඟබෝ ... 29
026 - වාසනා දිනේකි - ශ්‍රී වික්‍රම රාජසිංහ ... 30
027 - සුවඳ පත්ම - දුටුගැමුණු ... 31
028 - බෝ දොස් කියා - වෙස්සන්තර ... 32
029 - ගල්ලෙන බිඳලා - සිංහබාහු ... 33
030 - සෝභාව දේ - තාරාවෝ ඉගිලෙති ... 34
031 - යස ඉසුරු පිරුණු තැනා - රතුහැට්ටකාරි ... 35
032 - සුපිපුන සුගන්ධ - සුනිල් එදිරිසිංහ ... 36
033 - නිර්වාණ ස්වර්ණ ද්වාරයෙන් - සනත් නන්දසිරි ... 37
034 - කවුරුදෝ අර කවුලුවෙන් - සනත් නන්දසිරි ... 38
035 - සීත රෑ යාමේ - සනත් නන්දසිරි ... 39
036 - එක යායට මල් පීදුණු - සනත් නන්දසිරි ... 40
037 - මම නම් ආසයි - සනත් නන්දසිරි ... 41
038 - ආදර සැමරුම් කැටිවූ - සනත් නන්දසිරි ... 42
039 - කල්පනා ලොව මල් වනේ - අබේවර්ධන බාලසූරිය ... 43
040 - බඹරෙකු හැඬුවා - අබේවර්ධන බාලසූරිය ... 44
041 - ඇසේ මධුර ජීවනයේ ගීතා - ආනන්ද සමරකෝන් ... 45

042 - බැස සීතල ගඟුලේ - ආනන්ද සමරකෝන් .......... 46
043 - පොඩි මල් එතනෝ - ආනන්ද සමරකෝන් .......... 47
044 - රත්නදීප ජන්ම භූමි - අමරදේව .......... 48
045 - මල් වට්ටියක් - සුනිල් එදිරිසිංහ .......... 49
046 - මිනිසෙකු පිට නැගි - සුනිල් එදිරිසිංහ .......... 50
047 - දෑස නිලුපුල් තෙමා - ගුණදාස කපුගේ .......... 51
048 - සීතල සඳ එළියේ - ගුණදාස කපුගේ .......... 52
049 - දෙතොල නොකීදේ - ගුණදාස කපුගේ .......... 53
050 - සුදූ නැන්දා ඇයි - ගුණදාස කපුගේ .......... 54
051 - අභිසාරිකාවන්ගේ - ගුණදාස කපුගේ .......... 55
052 - ස්වර්ණ විමානෙට - අමරදේව .......... 56
053 - ඉරහඳ පායන ලෝකේ - අමරදේව .......... 57
054 - අහස උසට නැග ගියාට - සුනිල් එදිරිසිංහ .......... 58
055 - සැන්දෑ අහසේ - දයාරත්න රණතුංග .......... 59
056 - නුඹේ සිතට - සුනිල් එදිරිසිංහ .......... 60
057 - මගෙ අමල් බිසෝ - සුනිල් එදිරිසිංහ .......... 61
058 - සසර වසන තුරු - අමරදේව .......... 62
059 - උඩගු ලියන් - නන්දා මාලිනී .......... 63
060 - ලංකා ලංකා - සුනිල් ශාන්ත .......... 64
061 - අපි ඔක්කොම රජවරු- වික්ටර් රත්නායක .......... 65
062 - මේ සිංහල අපගෙ රටයි - නන්දා මාලිනී .......... 66
063 - යාලු බාල සඳේ - සෝමතිලක ජයමහ .......... 67
064 - අඳුරු කුටිය තුල - ටී. එම්. ජයරත්න .......... 68
065 - සිරි බුද්ධ ගයා විහාරේ - රුක්මනී දේවී .......... 69
066 - සැඳෑ අඳුර ලොව - සෝමතිලක ජයමහ .......... 70
067 - පියමන් කෙරුවෙමු - සෝමතිලක ජයමහ .......... 71
068 - වන්දනාවේ යමු - එම්. කේ. වින්සන්ට් - නිර්මලා .......... 72
069 - දම්පාටින් ලා සඳ - ගුණදාස කපුගේ .......... 73
070 - කවුරුන්ද ඔබ මගේ - සුනිල් එදිරිසිංහ .......... 74
071 - මිහිකත නලවාලා - සුනිල් ශාන්ත .......... 75
072 - පීනමුකෝ කළු ගගේ - අමරදේව සහ මල්ලිකා .......... 76
073 - තොටුපල අයිනේ - වික්ටර් රත්නායක .......... 77
074 - හිත මිතුරු සුළඟ - වික්ටර් රත්නායක .......... 78
075 - හෙමින් සැරේ පියා විදා - සුනිලා අබේසේකර .......... 79
076 - මා බාල කාලේ - සී. ටී. ප්‍රනාන්දු .......... 80
077 - සැන්දෑ වලාවන් - ක්ලැරන්ස් විජේවර්ධන .......... 81
078 - දිනෙක මේ නදී තීරේ - ක්ලැරන්ස් විජේවර්ධන .......... 82
079 - උඩරට නිළිය හැඩ වගේ - ඇනස්ලි මාලේවන .......... 83
080 - ආදරය නිසා - රුක්මණී දේවී .......... 84
081 - එන්න මදනලේ - තිලකසිරි ප්‍රනාන්දු .......... 85
082 - වරදක් කලත් - සනත් නන්දසිරි .......... 86
083 - අඩු කුලේ කියාලා - ඒ. ජේ කරීම් .......... 87
084 - පෙම් මල් මාලා - රුක්මණී දේවී .......... 88

085 - මුණි නන්දන සිරිපාද - ශ්‍රේටා ජෙනට් ........................................ 89
086 - සැළලිහිණි කොවුල් - සී. ටී. සහ ලතා ........................................ 90
087 - ඉරට මුවාවෙන් ඉඳගෙන - අමරදේව ........................................ 91
088 - රන් දහඩිය බිංදු බිංදු - අමරදේව ........................................ 92
089 - ඔබේ අත ගෙන - රෝහණ සිරිවර්ධන ........................................ 93
090 - යමුණා ගං තෙර - නන්දා මාලිනී ........................................ 94
091 - කඳුළු කථාවේ - අමරදේව ........................................ 95
092 - පාළු අඳුරු නිල් අහස - අමරදේව ........................................ 96
093 - ආජු තපර - දීපිකා ප්‍රියදර්ශණී ........................................ 97
094 - පිනිබර යාමේ - සුනිල් එදිරිසිංහ ........................................ 98
095 - සඳකඩ පහනක - සුනිල් එදිරිසිංහ ........................................ 99
096 - මී අඹ වනයේ - සී. ටී. ප්‍රනාන්දු ........................................ 100
097 - මී වදයකී ජීවිතේ - සී. ටී. ප්‍රනාන්ද ........................................ 101
098 - මම ගන්නෙමී කරකාර - ජෝතිපාල ........................................ 102
099 - ප්‍රෘතුගීසි කාරයා - ජෝතිපාල ........................................ 103
100 - කොල කඩ කඩ බොරුවට - ජෝතිපාල ........................................ 104



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

001 - අන්න බලන් සඳ - කුණ්ඩලකේශි

(අන්න බලන් සඳ රන් තැටියෙන් සුදු සීත ගඟුල් ගලනා ...
හද සෝක තැවුල් නිවනා ...)//
(චන්දන පල්ලව කෝකිල කූජන සංගීතයේ පැටලී ...)//
සුන්දර මේ වන තුල්ම යහන් ගැබ //
ආදර බස් කියනා .... හඬ දේව් දෙකන් පිනනා

(අත් වතුරින් තුරු පෙම්බරියන් බඳ බන්දා සෙනේ සිතිනේ ...
ලිය වැල් පැටලී ගොසිනේ...)//
පුෂ්ප පිපී මකරන්ද ගලා එයි මාරුතයේ හැපිලා ...//
මන් මද රංගන මංඩපයේ මෙම //
මන්ද බලා හිඳිනේ ...  තව පෙම්බර මා සාමිනේ ...

අන්න බලන් ...

x

002 - ප්‍රේමයෙන් මන රංජිත වේ - මනමේ

(ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ
පුෂ්පයෙන් වන සුන්දර වේ ලංකෘත වේ)//
ආලයෙන් වෙලී සැදී මෙලතා //
(මණ්ඩපයෙන් චන්ඩාතප
බණ්ඩිතවේ හිරු රජිඳුගෙ)// x2

(කෝකිල හඬ කන් පිනවයි රන් ස්වරයයි
රෑණ ගිරව් දෙන ගී සින්දු අම බින්දු)//
සැම දෙසේ සංගීත ඇසේ //
(පිපි තඹරින් නද බඹරින්
පියරැව් දෙන ලිය කිඳුරන)// x2

ප්‍රේමයෙන් මන ....

x

003 - දී කිරි දී කිරි - රතු හැට්ටකාරි

(දී කිරි දී කිරි ගෙනාවා දී කිරි
මිහිපිට කාටත් ගුණ දෙන දී කිරි)//

පැටියා මෝරපු දෙනගෙන් ගත් කිරි
හොඳහැටි උණුකොට නිවලා ගත් කිරි
නැවුම් මුට්ටියේ වත් කල මේ කිරි
පනමට ලාබයි මං දෙන මී කිරි - දී කිරි දී කිරි ...

කිරි විකුණාලා කාසි හොයන්නයි
අනාගතේ මාලිගා තනන්නයි
කුමාරයෙක් ගෙදරට කැන්දන්නයි
මුට්ටිය බිඳුනොත් ඔක්කොම ඉවරයි - දී කිරි දී කිරි ...

හිස මගෙ දෙදරයි දෙපා රුදා දෙයි
රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පනමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි
මගෙ මංගල්ලෙට ඔහෙලත් එන්නයි - දී කිරි දී කිරි ...

x

# 004 - දැක්කොත් පද්මාවතී - පද්මාවතී

ආලේ නොකරා බැරී ...
(දැක්කොත් පද්මාවතී ආලේ නොකරා බැරී) //
ලලාටේ චන්ද්‍රයා සේ පෙනේ
ලලාටේ චන්ද්‍රයා සේ පෙනේ
(දැක්කොත් පද්මාවතී ආලේ නොකරා බැරී)//

(මේඝ සේ කේසාවේ ඇගේ ග්‍රීව සක් සේ වේ) //
(අහෝ ඇගේ ග්‍රීව සක් සේ වේ) //
ලැමද හංසයන් සේ පෙනේ
ආලේ නොකරා බැරී - දැක්කොත් පද්මාවතී ආලේ නොකරා බැරී

(මුක්තාසෙ දන්තාවේ ඇගේ වර්ණ ස්වර්ණා වේ) //
(අහෝ ඇගේ වර්ණ ස්වර්ණා වේ) //
ලැමද හංසයන් සේ පෙනේ
ආලේ නොකරා බැරී
(දැක්කොත් පද්මාවතී ආලේ නොකරා බැරී) //

x

MadhuraGeet

Touch through music

## 005 - සත් සියක් කපු මල් රැගෙන මම - කුවේණි

සත් සියක් කපු මල් රැගෙන මම
සත් සියක් සුදු කෙඳි රැගෙන මම
සත් සියක් කපු පිළි වියන මම
(සත් සියක් දෙන පළඳිතේ) //// x2

සත් සියක් රත්මල් රැගෙන මම
සත් සියක් රත්හුය රැගෙන මම
සත් සියක් මල් දම් ගොතන මම
(සත් සියක් ගෙල පළඳිතේ) //// x2

සත් සියක් මායා බෙලෙන් මම
සත් සියක් බන්ධන බෙලෙන් මම
සත් සියක් සක්වල සොයා මම
(ගෙන්වු කුමරුන් අද එතේ) //// x2

x

006 - සාන්ත ජෝන්ගේ වීදියේ කඩේ - බැලසන්ත

සාන්ත ජෝන්ගේ වීදියේ කඩේ //
මාළු වෙළඳාම මාළු වෙළඳාම
සාන්ත ජෝන්ගේ වීදියේ කඩේ

මාළු කඩේ වටේ ගැනු පාලු නැතුව ඉදිති පේනු //
සවස දෙකේ ඉදලා රෑ // නවය දහය පසුවන තුරු //
ඉස්සන් කූනිස්සන් හාල් මැස්සන් පොකිරිස්සන් යස //
(හොඳ බලයන් ඇටනගුලන්
බෝ ලාබෙට බෝ විකිණේ) //

සාන්ත ජෝන්ගේ...... /

(මෙව්වා ගන්නට තම්බිලා තම්බි
අප්පුලා ආයලා සිංකෙදෝලා) //
බොහොවු ජාති දෙමළ ඉංග්‍රීසි //
තුපහින්ද අරාබි එති //
නෙක නෙක දිග රන් පාටැති නන් නන් මාලුන් විකිණෙති //
රටලබු වම්බටු කරපිංච ද සේරද විකුණන්නෙය //

සාන්ත ජෝන්ගේ...... //

X

## 007 - හරිම් රජ සැපා - දුටුගැමුණු

හරිම් රජ සැපා මම ලක්දිව තී නිසා //
සොඳුරු ළඳේ මියුරු කතේ තොප හැර සැප නැතේ //
හරිම් රජ සැපා මම ලක්දිව තී නිසා

ජාතිය මගේ බාල නිසා ආලෙට බියයි මං //
ආලය බෙලෙන් ගෝත්‍ර ගතී //
සුන් කරලාමි මම් ……
හරිම් රජ සැපා මම ලක්දිව තී නිසා //

ප්‍රාණය සරී ස්වාමිට මගේ ආලය වෙමි තිරා //
ප්‍රීතිව ගියේ හර්දේ මෙමගේ //
කෞමද වගේ පුන්- පෝදා …..

හරිම් රජ සැපා මම ලක්දිව තී නිසා //
සොඳුරු ළඳේ මියුරු කතේ තොප හැර සැප නැතේ //
හරිම් රජ සැපා මම ලක්දිව තී නිසා //

x

## 008 - මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ - විධුර ජාතකය

මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ
අපේ උද්‍යානෙ ක්‍රීඩා සැපා වේ
යස රම්‍යා වූ සන්ධ්‍යාවකි මේ
අපේ උද්‍යානෙ ක්‍රීඩා සැපා වේ

සූර්යයා යයි බැසී චන්ද්‍රයා එයි නැගී
බිඟු රාසී මධු ලෝලෙන් හැසිරෙන්නා
කෝකිලාදි පක්ෂි ගීත රැව් දී නැගේ
අපේ උද්‍යානෙ ක්‍රීඩා සැපා වේ

>

## 009 - කවාලා විළඳ ජාතී - රොඩී කෙල්ල

(කවාලා විළඳ ජාතී
ඇති කලත් රන් කුඩුවේ ගිරවා
දමාලා යන්නෙ ඉගිලී
රැව්දිදී ලබනාසෙ වන සැපතා) //

(උපන්නොත් යම් කෙනෙක් මෙලොවේ
මරණයත් කොටා ඇත නළලේ)//
මරණයක් ඇයිද මේ කෙටුවේ මහබඹා
මණුසතා නළලේ

කවාලා ......

(කිරෙන් කා තෙලෙන් අත සෝදා
අපේ මේ ජීවිතේ ගෙවනා)//
දූවන්නැයි සිරුරැ කුඩුව මෙහි දමාලා
ආව කල මරුවා

කවාලා ......

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

010 - ලෝනා මුණි රාජගේ - හේමමාලි

(ලෝනා මුණි රාජගේ ශ්‍රී දළදා පෙන්වමී)//

(මාගෙ හිසකේ ගර්භයෙහී) // සඟවා ගෙන ආ සාදරෙන්
මාගෙ හිසකේ ගර්භයෙහී (සඟවා ගෙන ආ සාදරෙන්) //
(ලෝනා මුණි රාජගේ ශ්‍රී දළදා පෙන්වමී)//

(අත්ලට ස්වාමී ගේ වඩවමී) // දාඨාදා අප දියනාගේ
අත්ලට ස්වාමී ගේ වඩවමී (දාඨාදා අප දියනාගේ) //
(ලෝනා මුණි රාජගේ ශ්‍රී දළදා පෙන්වමී)//

x

011 - අඹ දඹ නාරන් - රාමායණය

(අඹ දඹ නාරන් කෙසෙල් දෙල්
පනා කකා මේ වනා සැපා ලබනෙමි)//
(ගංගාවේ ඕලු ඇතේ එවායේ කෑම නැතේ
ඈත පුෂ්ප අත්තෙ අත්තෙ එවා පිපෙයි)//

අඹ දඹ.......//

(පක්ෂී නාදේ රෑත් ඇසේවී හීන් හඬම දෙත් නයි)//
(මල්ලිකා වැල් බොහෝ තිබෙන්නා)//
විශාල මෙවනේ මම් - (ප්‍රවෙසම් බෝම වෙලා ඉන්නම්)//
(වාස සොඳා බැද්දෙ මෙදා ප්‍රීති හදා වෙයි නිබඳා
බෝ මාදන් ඇත්තෙ මේ ගසේ)//
අඹ දඹ ........//

(පක්ෂී නාදේ රෑත් ඇසේවී හීන් හඬම දෙත් නයි)//
(මල්ලිකා වැල් බොහෝ තිබෙන්නා)//
විශාල මෙවනේ මම් - (ප්‍රවෙසම් බෝම වෙලා ඉන්නම්)//
(වාස සොඳා බැද්දෙ මෙදා ප්‍රීති හදා වෙයි නිබඳා
බෝ මාදන් ඇත්තෙ මේ ගසේ)//
(අඹ දඹ නාරන් කෙසෙල් දෙල්
පනා කකා මේ වනා සැපා ලබනෙමි)//
(ගංගාවේ ඕලු ඇතේ එවායේ කෑම නැතේ
ඈත පුෂ්ප අත්තෙ අත්තෙ එවා පිපෙයි)//
X

## 012 - දන්න වං හුං - ශ්‍රී වික්‍රම

දන්න වං හුං අප කන්නසාමි රාජ ධුරයේ //
රාජ ධුර රාජ ධුර රාජ ධුරයේ //
දන්න වං හුං අප කන්නසාමි රාජ ධුරයේ //

රකී බුද්ධ ධර්ම සීල පුර්වේ රජුන් ලෙසේ//
අධර්මිෂ්ඨ නීච ක්‍රියා යයි මැකී ලකේ//
යයි මැකී යයි මැකී යයි මැකී ලකේ //
දන්න වං හුං අප කන්නසාමි රාජ ධුරයේ //

දනී සිංහලුන්ගෙ ශාස්ත්‍ර ආගම් මනා ලෙසේ//
ඉතින් ප්‍රීති වෙන්න යමවු ඒ තුමා වෙතේ//
ඒ තුමා ඒ තුමා ඒ තුමා වෙතේ//

දන්න වං හුං අප කන්නසාමි රාජ ධුරයේ //
රාජ ධුර රාජ ධුර රාජ ධුරයේ //
දන්න වං හුං අප කන්නසාමි රාජ ධුරයේ //

x

013 - ඇස ප්‍රීති කරන රූපා - මානාභරණ

ඇස ප්‍රීති කරන රූපා නැතිවී යතීය නොහැඟී
නොදිරාවි නාම සුන්දරා පවතී දනන්ගෙ සිත්හී
ඇස ප්‍රීති කරන රූපා නැතිවී යතීය නොහැඟී

මෙම ලෝකෙ පාපයේ ගැලී විසුවොත් දුක නියමයි//
ත්‍රිවිධ ලෝක සැප ලැබීමටා පංච පාපයෙන් මිදීලා
ඇස ප්‍රීති කරන රූපා නැතිවී යතීය නොහැඟී

මුනිඳුන් දෙසූ එ ධර්මා සිත්සේ රකිව් මෙතපා //
ත්‍රිවිධ ලෝ සැප ලැබීමටා පංච පාපයෙන් මිදීලා

ඇස ප්‍රීති කරන රූපා නැතිවී යතීය නොහැඟී
නොදිරාවි නාම සුන්දරා පවතී දනන්ගෙ සිත්හී
ඇස ප්‍රීති කරන රූපා නැතිවී යතීය නොහැඟී

X

014 - ආරණ්‍යේ ඉන්නා - සිවම්මා ධනපාල

(ආරණ්‍යේ ඉන්නා මේ රම්‍යා කතේ
ශ්‍රියා කාන්තාව සේමා පෙනේ)//
ශ්‍රියා කාන්තාව සේමා පෙනේ //
ආරණ්‍යේ ඉන්නා මේ රම්‍යා කතේ
ශ්‍රියා කාන්තාව සේමා පෙනේ x 2

සදමින් අශෝක මාලා රැකෙෂ් මෙ ඉන්නා කව්ද තී රම්‍යා කතේ //
චණ්ඩාල ගෝත්‍රේ චණ්ඩාල කන්‍යා// ප්‍රේමිට හර්දේ පුදම්
රතීශ්වරී ප්‍රේමිට හර්දේ පුදම්

(ආරණ්‍යේ ඉන්නා මේ රම්‍යා කතේ
ශ්‍රියා කාන්තාව සේමා පෙනේ) //

සදමින් අශෝක මාලා රැකෙෂ් මෙ ඉන්නා කව්ද තී රම්‍යා කතේ //
චණ්ඩාල ගෝත්‍රේ චණ්ඩාල කන්‍යා// ප්‍රේමිට හර්දේ පුදම්
රතීශ්වරී ප්‍රේමිට හර්දේ පුදම්

(ආරණ්‍යේ ඉන්නා මේ රම්‍යා කතේ
ශ්‍රියා කාන්තාව සේමා පෙනේ) //
(ශ්‍රියා කාන්තාව සේමා පෙනේ) //
(ආරණ්‍යේ ඉන්නා මේ රම්‍යා කතේ
ශ්‍රියා කාන්තාව සේමා පෙනේ) //

x

MadhuraGeet

Touch through music

## 015 - ආලෙ බැන්ද - දික්තල කාලගෝල

ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් ඒ...ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්//

මේ සුනිමල මගෙ දික්තල//
ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් ඒ...ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්

අවුරුදු සතක් දුකින මෙහෙවර කර මෙමා//
ගත් ළඳුන් මගේ - ඈගෙ රූපෙ බොහො අගේ//
ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් ඒ...ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්//

යන්නට ගමට මේදින  මව් පියන් දකින ලෙසින//
තෑගි ලෙසට දැන් - ගෙන යාමි රස කැවුම් //

ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් ඒ...ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් //
මේ සුනිමල මගෙ දික්තල //
ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් ඒ...ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් //

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

016 - ඇන්නැවෙ මේ මළ කෝලං - දික්තල කාලගෝල

ඇන්නැවෙ මේ මළ කෝලං (පාරෙ යන්නට බෑ මුන්දෑ සමගින්)//
ඇන්නැවෙ මේ මළ කෝලං (පාරෙ යන්නට බෑ මුන්දෑ සමගින්)//

මව්පියො නිදහස් වෙන්ට සිතා බැඳ (දුන්නෙය මා මේ අඟුටුමිටියට)//
මව්පියො නිදහස් වෙන්ට සිතා බැඳ (දුන්නෙය මා මේ අඟුටුමිටියට)//

(අඟුටුමිටියටා වට මං සුන්දරියේ නැද්ද හැඩරුව මං
ඇයි සුන්දරියේ නැද්ද හැඩරුව මං)//

(කාලා බීලා සැප සේ හිඳ කල්හැර)//
(එව්වා මෙව්වා කිව්වේ කවුරුද නුඹට)//

ඇන්නැවෙ මේ මළ කෝලං
(පාරෙ යන්නට බෑ මුන්දෑ සමගින්)//
ඇන්නැවෙ මේ මළ කෝලං
(පාරෙ යන්නට බෑ මුන්දෑ සමගින්)//

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

# 017 - රතදර සිරියා පරදන - දික්තල කාලගෝල

(රතදර සිරියා පරදන රූපෙට වටිනා නිමල කොමල තරුණී)//

(අයියෝ මාගේ යෞවන කාලේ මෙහෙමද පසුවෙන්නේ)//
(නැත කිසි ආලේ මාගේ අඟුටුම්ටියටා මව්පියෝ අත බැඳ දුන්)//
(රතදර සිරියා පරදන රූපෙට වටිනා නිමල කොමල තරුණී)//

(ඇත්තේ චිත්තේ මාගේ බෝසේ මේ වූ දුක පමණයි)//
(නැත කිසි ආලේ මාගේ අඟුටුම්ටියටා මව්පියෝ අත බැඳ දුන්)//
(රතදර සිරියා පරදන රූපෙට වටිනා නිමල කොමල තරුණී)//

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

(අද වෙස්සන්තර රාජ පුතා මන්ද්‍රී කුමාරි බදී
දෙවෝපකාර වෙවා සෑදී සෙත්)//
(රට වැස්සන්ගේ කාලෙ හොදා දූර්භික්ෂ යාය සිදී
මංගල්ලෙ සාර වෙවා සෑදී සෙත්)//

(බෝම ප්‍රීති ඝෝෂා ඇසෙන්නා මේ සිව් දිසා)//- - -
(සෙත අත් පත් වෙවා මන්ද්‍රී කුමරි හට දැන්)//
(රාජ සම්පත් නොමින් දේය රාජා උතුම්)//
කුමරාගෙ පිනක් මැයි වාසනා බෝ වාසනා බෝ

අද වෙස්සන්තර රාජ පුතා ....

(බෝම ප්‍රීති ඝෝෂා ඇසෙන්නා මේ සිව් දිසා)//- - -
(සෙත අත් පත් වෙවා මන්ද්‍රී කුමරි හට දැන්)//
(රාජ සම්පත් නොමින් දේය රාජා උතුම්)//
කුමරාගෙ පිනක් මැයි වාසනා බෝ වාසනා බෝ ...

අද වෙස්සන්තර රාජ පුතා ....

X


Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 019 - සිරි සංඝ බෝධි - සිරිසඟබෝ

(සිරි සංඝ බෝධි මාළිගාවෙ දි මං
දැක ප්‍රාණෙ හානි වෙන්ට බැට දෙම්) //
(අල්ලා බන්දා රන්දා බින්දා උන්දැ කොන්දා ලාමි සින්දා
සැන්දෑ කාලෙ මාළිගාවෙ ඉන්නවා සොයා)//
ධර්මෙ සීලෙ රක්නා රාජා ලාමි දිවි නසා
කර්මෙ වෙන්නෙ පස්සෙ හින්දා කිම්ද දෝසයා
(කෝලහාල සිද්ධ වෙන්ට කාලෙ බෝසොදා) //
(තේජසාර සීලවන්ත ධර්ම සංඝ බෝධිරාජ
බංගකර ලාමි නෑර මාළිගා සොයා)//

සිරි සංඝ බෝධි මාළිගාවෙ දි මං
දැක ප්‍රාණෙ හානි වෙන්ට බැට දෙම්

(අල්ලා බන්දා රන්දා බින්දා උන්දැ කොන්දා ලාමි සින්දා
සැන්දෑ කාලෙ මාළිගාවෙ ඉන්නවා සොයා)//
ධර්මෙ සීලෙ රක්නා රාජා ලාමි දිවි නසා
කර්මෙ වෙන්නෙ පස්සෙ හින්දා කිම්ද දෝසයා
(කෝලහාල සිද්ධ වෙන්ට කාලෙ බෝසොදා) //
(තේජසාර සීලවන්ත ධර්ම සංඝ බෝධිරාජ
බංගකර ලාමි නෑර මාළිගා සොයා)//

(සිරි සංඝ බෝධි මාළිගාවෙ දි මං
දැක ප්‍රාණෙ හානි වෙන්ට බැට දෙම්)//
X

020 - ගම්බිර තෙදැති - බැලසන්ත

ගම්බිර තෙදැති කොන්ස්තන්තීනු පුරේ කොන්ස්තන්තීනු පුරේ
(පුරවර්ධන කරන අග නරනා මෙමං)//
(නාමය මං අලිසන්දිරී)//
මම ධර්මෙන් මෙපුර පාලන කරමින්නේ - ධර්මෙන් මෙපුර පාලන කරමින්නේ
(ඉන්නේ මැඳුරෙ ප්‍රීතිය විඳිමින්නේ)//
එහෙම උනත් මෙමට ඇත ලොකුම දූකක්
මෙමට ඇත ලොකුම දූකක්
(කරකාරියක් නැතිව සිත නොමැත සැපක්)//

(එය විසඳා ගන්නා ලෙදා)//
මගෙ මන්ත්‍රී කැඳව මම පහදා කියමි එය
මන්ත්‍රී කැඳව මම පහදා කියමි එය
(නොමැත ළඳක් මෙහෙසිය ලෙස ගන්නට)//

ගම්බිර තෙදැති කොන්ස්තන්තීනු පුරේ කොන්ස්තන්තීනු පුරේ
(පුරවර්ධන කරන අග නරනා මෙමං)//

X

## 021 - මොරොට්ටු ගම්මන - ??

(මොරොට්ටු ගම්මන සුරුට්ටු උරමින
තොරොට්ටු වැඩදත් පුරන් බාස් මම
වඩුවැඩ ලංකාවේ හොඳ තරමට දන්නා
වඩුවැඩ ලංකාවේ) //

(බාල්ක රීප්ප හරියට තියලා - සිවිලිං තට්ටුව කැටයම් කරලා)//
හොඳ වැඩ හපනෙකි මං
මේ කාලේ හැටියට හොඳ වැඩ හපනෙකි මං
මොරොට්ටු ගම්මන ...

(තේක්ක කරුවල කියතෙන් ඉරලා අඟලට නුලට බොරදං ගාලා)//
සදතැකි අල්මාරී මේ කාලේ හැටියට - සදතැකි අල්මාරී
මොරොට්ටු ගම්මන ...

(නුල්ද ඇද මාදැල් ද ගොතාලා වාරකනට දැල් පස්සට ඇදලා)//
අන්නැවි රාළෙකි මං මේ කාලේ හැටියට
අන්නැවි රාළෙකි මං
මොරොට්ටු ගම්මන ...

X

## 022 - සීතා මා ශ්‍රීයා ඉන්නේ - රාමායණය

(සීතා මා සිරියා ඉන්නේ කොහෙදෝ අනේ මෙකලා
බොහොවීය ශෝකා මාගේ දෙදරා හදා)//

(මේවර යාවී නිසැකා ඇව නොදැක මගේ)//
මෙහි මැරීයාම වේ දැන් රාවණා කළේ මෙ විනේ
බොහොවීය ශෝකා මාගේ දෙදරා හදා

(සීතා මා සිරියා ඉන්නේ කොහෙදෝ අනේ මෙකලා
බොහොවීය ශෝකා මාගේ දෙදරා හදා)//

(මේවර යාවී නිසැකා ඇව නොදැක මගේ)//
මෙහි මැරීයාම වේ දැන් රාවණා කළේ මෙ විනේ
බොහොවීය ශෝකා මාගේ දෙදරා හදා

(සීතා මා සිරියා ඉන්නේ කොහෙදෝ අනේ මෙකලා
බොහොවීය ශෝකා මාගේ දෙදරා හදා)//

x

023 - පත්මේකි සේම මුණා - රාමායණය

(පත්මේකි සේම මුණා සොඳ මුණා
දිලි සඳකි සරත් කාලේ මෙ කාලේ)//

(උන්මාද වෙන්නා සිත මුණ බලා වාසනා)//
අහො පාවා ගනීදෝ මේමා
(පත්මේකි සේම මුණා සොඳ මුණා
දිලි සඳකි සරත් කාලේ මෙ කාලේ)//

(අත් පාද වාත්තු කළ සේම ඉතා ලක්ෂණයි)//
ලෙස රූපේකි රනින් සෑදූ
(පත්මේකි සේම මුණා සොඳ මුණා
දිලි සඳකි සරත් කාලේ මෙ කාලේ)//

x


Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 024 - ඇයි තරහෙන් - රත්නාවලී නාටකය

(ඇයි තරහෙන් මානකාරී පලා දුවන්නේ දමලා මා මෙහි
පලා දුවන්නේ දමලා මා)// ඇයි තරහෙන්

(ඉවසිලි වන්තී කෝප නොවේවී ශාන්ත දාන්ත වී)//
කෝපය නෑ නෙත බැලුවම තීගේ//
සන් සුන් ලීලාවෙන් තිබේ
සෑදී තිබේ සුබාව සේවේ
එපාය මිතුරී ගැන සංවල් සකි
එපාය මිතුරී ගැන සංවල් - ඇයි තරහෙන්

(කවට කමින් මා ඇස් රතු වෙද්දී ශාන්ත වන්තියගේ)//
(අල්ලා ස්වාමිනි දකුණත ඈගේ)//
ඉල්ලා දෙන්න සමා
නෙතේ නැතේ එකෝප බැල්මා
සිත්හි පවතී තද කෝපා ඈගෙ
සිත්හි පවතී තද කෝපා

ඇයි තරහෙන් මානකාරී පලා දුවන්නේ දමලා මා මෙහි
පලා දුවන්නේ දමලා මා - ඇයි තරහෙන්

x

## 025 - දන්නො බුදුන්ගේ - සිරිසඟබෝ

(දන්නො බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා
ජේවී රකිති සොඳ සීලෙ නිබන්දා)//

ක්ලේශ නස්නා භික්‍ෂු ඇත්තෙය බෝසේ //
රහතුන් නිවාසනා පායා ප්‍රකාසේ //
බුලෝමතේ මේ දෙව්ලෝ පැවා සේ
ජේනා මෙපුර මුණි සාසන වාසේ

එර්දියෙන් යන්නාවූ නෙක් රහතුන්ගෙ //
සෙවනැල්ලෙනි හිරු රශ්මිය භංගේ //
මානෙල් නෙලුම් හා ඕලු පුෂ්පාදී
ඇත්තෙ පොකුණුවල බෝ ජල පැදී

සේරුද පන්තී පන්තී පීනති බෝසේ //
අනුරාධ නගරය දැන් පෙනේ ඔස්සේ //
දන්නො බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා
ජේවී රකිති සොඳ සීලෙ නිබන්දා

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

වාසනා දිනේකි මේක පාමු තුටින් සිතේ
වාසනා දිනේකි මේක පාමු තුටින්
පාමු තුටින් නටමු මේ ලී දරා අතේ
වාසනා දිනේකි හහා - වාසනා දිනේකි හොහෝ
වාසනා දිනේකි මේක පාමු තුටින් සිතේ
වාසනා දිනේකි මේක පාමු තුටින්

කෝමල මධුර බසිනී මේ ගී - සාදා පවසමු දැන්
නටමු පේළි පේළි ගැසී - රජිඳා තුටු වන මෙන්

(සිරියා වසාය උරේ ආසාවේ භූපතී)//
තේජසා තිබේය දීපෙ ආලෝක වී අපේ
තේජසා තිබේය දීපෙ ආලෝක වී
ආලෝක වී රජිඳු බෝ ප්‍රීති වේ අපේ // තේජසා තිබේය දීපෙ ආලෝක
වී අපේ තේජසා තිබේය දීපෙ ආලෝක වී

(නට නට කිංකිණි නාද දී අපි යමු පාරේ
තුති දිදී බොහෝ සේ භූපති ලක වැජඹේවා)//
නිතිනා නිරෝගි වෙවා රාජා මේ සිංහලේ //

වාසනා දිනේකි මේක ....

x

027 - සුවඳ පත්ම - දුටුගැමුණු

(සුවඳ පත්ම ඕලු ආදී නොයෙක පුෂ්පයෙන් සැදී)//
(සරණ හංස සේරු බෝම පොකුණු සීත පැන් පිරී)//
සුවඳ පත්ම ඕලු ආදී නොයෙක පුෂ්පයෙන් සැදී

(වතුර නාන නෙක් දනෝ)// පැමිණ නාති ග්‍රීෂ්ම යන්ට
(මමද නාග ලෝකයෙන්ම මෙපුර ආමි නාන සේ)//
සුවඳ පත්ම ඕලු ආදී නොයෙක පුෂ්පයෙන් සැදී

(පෙනෙති ථූප මේ පුරේ)// වඩිති ඊට දීප වාසි
(රකිති ධර්ම ශාක්‍ය වංස මුණිඳු දේශනා ලෙසේ)//

(සුවඳ පත්ම ඕලු ආදී නොයෙක පුෂ්පයෙන් සැදී)//
(සරණ හංස සේරු බෝම පොකුණු සීත පැන් පිරී)//
සුවඳ පත්ම ඕලු ආදී නොයෙක පුෂ්පයෙන් සැදී

x

## 028 - බෝ දොස් කියා - වෙස්සන්තර

බෝ දොස් කියා මාගෙ බෝ දොස් කියා
සිව් දේසේ වැසියෝ කිපී
සිව් දේසේ වැසියෝ කිපී
පන්නා මා ලුය මෙවන
පන්නා මා ලුය මෙවන
බෝ දොස් කියා මාගෙ බෝ දොස් කියා

(දාසින් ලබා ගෙනා සම්බවෙන්ට සුන්දරී //
යන්නටා හැකී වේදෝ //
දානෙ දෙයිද වෙස්සන්තර
දානෙ දෙයිද වෙස්සන්තර
බෝ දොස් කියා මාගෙ බෝ දොස් කියා
සිව් දේසේ වැසියෝ කිපී
සිව් දේසේ වැසියෝ කිපී
පන්නා මා ලුය මෙවන
පන්නා මා ලුය මෙවන
බෝ දොස් කියා මාගෙ බෝ දොස් කියා) x 2

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 029 - ගල්ලෙන බිඳලා - සිංහබාහු

ගල්ලෙන බිඳලා - ලෙන්දොර හැරලා සිංහබා සිංහබා සිංහබා //
මා සොඳුර මා සොඳුර මා සොඳුර
සිංහ සීවලී මා ප්‍රිය දියණිය
ගල්ලෙන බිඳලා - ලෙන්දොර හැරලා
ගොසින් සැම දෙන නැතේ කිසිවෙක්
මම දැනගතිමී මම සැක කළෙමී - සිංහබා සිංහබා සිංහබා

ලෙන තුළ නොවෙති පෙරළා නොඑති //
මම දැනගතිමි මම සැක කළෙමි //

(සුරතල් දියණිය මොළ කැටි වදනින්
මා සනසන්නිය - අහර පිසන්නිය) //
(කවන්නිය පොවන්නිය මා ගැන බියවන්නිය
වනයේ දුකක් විඳ අසන්නිය සොයන්නිය) //

ඈත් ගොසින්ය ඈත් ගොසින්ය
(ඇයි සුදු දුවණියෙ නුඹවත් නොසිටියෙ) //
(සොහොයුරා නම් ඔළමොල ගති ඇත
නුඹ මෙන් මුදු නැත) //

ඔහුගේ අණටද කීකරු වූයේ පෙරළා එන්නෙද ඔහුගෙන් ගැලවී //

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

සෝභාව දේ මෙපුර සිරි විසිතුරු බලනු මිතුරු මග පියකරු වූ
සුසුදු වළා කැරලි පලසකි මේ මග දිග ඇතිරූ අහස සුරන මැදුරූ

පාර දෙපැත්තේ සොඳුරු සල්පිල් මැද
දෙව්ලොව නැති සැප විකුණන්නේ
නුවරු රිසි රිසි දේ ගෙන මසුරන් තඹයට දෙන්නේ
නිඹඳ සිත ලතවෙන්නේ
සෝභාව දේ...

(ජේත්තුකාර ලියන් ගත විලවුන් මුහුණ සිඹින්නා
සාටක දූහුල ඉරන් නාරිලතා මල් පුදින්නා) //
දැසින් අමතන බස් වැසුනු දොරක් විවර කරන්නේ
එලිපිට ඇත අවකෙලි කිසිවෙකු මැසිවිලි නොකියන්නේ
සෝභාව දේ...

(සැණකෙලි පුරා හඬේ නිකිනි අවන්හල් පිබිදෙන්නා
ඇසුවන් දුක් සින්දන ගී සින්දු සවන පිනන්නා)//
සත හට සෙත සලසා අතකින් මධුවිත පුරවන්නේ
සවුදිය පුරන ළඳත් රකුසු නෙතත් පාළු මකන්නේ
සෝභාව දේ...

X

031 - යස ඉසුරු පිරුණු තැනා - රතුහැට්ටකාරි

(යස ඉසුරු පිරුණු තැනා සිරි දෙවිඳු සිටින තැනා)//
(ළඟම ඇතේ දුරක නැතේ)// අපි යන්නේ ඒ පාරේ
(යස ඉසුරු පිරුණු තැනා සිරි දෙවිඳු සිටින තැනා)//

යුක්තිගරුක අතීතයට කැන්දන් යම් මම
දස රාජ ධර්ම කල තෙද වීර රජුන් ඇත
(ඇස් ඉදිරියෙ උඹ ලඟ) //
අතීතයේ ඉස්තෝරුව එදා ඉඳන් මම
නිදි මර මර මුර කොට බහිරව බිලිපුද කොට
(රැක ගත්තේ නුඹලාට) //
(යස ඉසුරු පිරුණු තැනා සිරි දෙවිඳු සිටින තැනා)//

රජවරු රජ මැතිවරු යස රාජ බිසෝවරු
කල කෙලි සෙල්ලම් දැක තව කාසි දියන් මට
(හොඳ තෑගි දියන් මට) // x2
(යස ඉසුරු පිරුණු තැනා සිරි දෙවිඳු සිටින තැනා)//
(ළඟම ඇතේ දුරක නැතේ)// අපි යන්නේ ඒ පාරේ

x

032 - සුපිපුන සුගන්ධ - සුනිල් එදිරිසිංහ

සුපිපුන සුගන්ධ යුත් සොඳ පුෂ්පා //

සිඹිමින් නෙලමින් //
නෙලමින් මම යම් යම් උද්‍යානයේ //
උදයේ රම්‍යා නෙලමින්නේ
සුපිපුන සුගන්ධ යුත් සොඳ පුෂ්පා //

බිඟුරාසී හැම කාලේ
ඈත කෝපේ කුමරී හා
(මල් නෙලන්නෙමී මං
ගොතන්ට මාලා රජ දූවනීයන්ටා) //

මෙ වාරේ නෙලන්ට කුසුමන් යාමි //
සුපිපුන සුගන්ධ යුත් සොඳ පුෂ්පා //

බිඟුරාසී හැම කාලේ
ඈත කෝපේ කුමරී හා
(මල් නෙලන්නෙමී මං
ගොතන්ට මාලා රජ දූවනීයන්ටා) //

මෙ වාරේ නෙලන්ට කුසුමන් යාමි //
සුපිපුන සුගන්ධ යුත් සොඳ පුෂ්පා //

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 033 - නිර්වාණ ස්වර්ණ ද්වාරයෙන් - සනත් නන්දසිරි

(නිර්වාණ ස්වර්ණ ද්වාරයෙන් පිවිසු තිලෝ සතුන්
සම්බෝධි රාජ පාද පද්ම වන්දනා කරමි)//

(ක්ලේශ තාපයෙන් අනන්ත වේදනා ජලේ)//
නවුකාව දම් අමා වඩිමි නමා නලල් තලේ

නිර්වාණ ස්වර්ණ ද්වාරයෙන් පිවිසු තිලෝ සතුන්
සම්බෝධි රාජ පාද පද්ම වන්දනා කරමි

(දැගසවු රහත් බුදුන් මා සිතින් පුදා) //
වන්දාමි සඟරුවන් සදින් මලින් බැතින් සදා

නිර්වාණ ස්වර්ණ ද්වාරයෙන් පිවිසු තිලෝ සතුන්
සම්බෝධි රාජ පාද පද්ම වන්දනා කරමි

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 034 - කවුරැදෝ අර කවුළුවෙන් - සනත් නන්දසිරි

(කවුරැදෝ අර කවුළුවෙන් හිනාවී එබිකම් කලේ
ඒ හිනාවෙන් මා වෙලන්නද මා වෙලාගන මට තලන්නද
ඈ හිනාවෙන්නේ) //

(ඉතින් මට බැහැ ඈත යන්නට ඒ නුවන් රැහැණින් මිදීලා)//
කවුළුවේ දොර හදින් ඇරගෙන නෙත් ලගින් ඉන්නම්

කවුරැදෝ අර කවුළුවෙන් හිනාවී එබිකම් කලේ
ඒ හිනාවෙන් මා වෙලන්නද මා වෙලාගන මට තලන්නද
ඈ හිනාවෙන්නේ

(කතා නොකරන තාරකාවක් පාර කීවත් මම නොයන්නම්)//
කවුළුවේ දොර හදින් ඇරගෙන නෙත් ලගින් ඉන්නම්

කවුරැදෝ අර කවුළුවෙන් හිනාවී එබිකම් කලේ
ඒ හිනාවෙන් මා වෙලන්නද මා වෙලාගන මට තලන්නද
ඈ හිනාවෙන්නේ

X

035 - සීත රෑ යාමේ - සනත් නන්දසිරි

සීත රෑ යාමේ අඳුරේ වාසනා නිල් දෑස පායා
ආදරේ උණුසුම් සුසුම් මැද මා හදේ රහසේ රැඳුනා
දුලීකා .. දුලීකා .. දුලීකා .. දුලීකා ..

මා බලා සිටියා දිවා රෑ කල්පනා යහනේ
නෑ එවන් රුව තාම දුටුවේ නාඳුනන සිහිනේ
සීත රෑ යාමේ අඳුරේ වාසනා නිල් දෑස පායා
ආදරේ උණුසුම් සුසුම් මැද මා හදේ රහසේ රැඳුනා
දුලීකා .. දුලීකා .. දුලීකා .. දුලීකා ..

මා ඔබේ හසරැල් ජලාශේ කිමිදෙනා මොහොතේ
ඔබ සොයා එන්නම් ඉගිල්ලී තාරකා එලියේ
සීත රෑ යාමේ අඳුරේ වාසනා නිල් දෑස පායා
ආදරේ උණුසුම් සුසුම් මැද මා හදේ රහසේ රැඳුනා
(දුලීකා .. දුලීකා .. දුලීකා .. දුලීකා ..)///

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

MadhuraGeet

Touch through music

## 036 - එක යායට මල් පිදුණු - සනත් නන්දසිරි

(එක යායට මල් පිදුණු බිම් තීරේ
පාර දිගේ කනින් කනට කොඳුර කොඳුර
ඔබයි මමයි විතරයි හිටියේ)//

(රාස්සිගේ අව්ව වැටී දඹරන් වූ ඔබ කෙහෙරැලි)//
සුලං සමග පොර බැදුවා
ඔබට මතක නැති උනාට අද වාගේ මතකයි මට

එක යායට මල් පිදුණු බිම් තීරේ
පාර දිගේ කනින් කනට කොඳුර කොඳුර
ඔබයි මමයි විතරයි හිටියේ

(ගොපලු කොලුගෙ බටනලාව සංගීතය මවන අතර)//
දොලේ දියෙන් පා දෙව්වා
ඔබට මතක නැති උනාට අද වාගේ මතකයි මට

එක යායට මල් පිදුණු බිම් තීරේ
පාර දිගේ කනින් කනට කොඳුර කොඳුර
ඔබයි මමයි විතරයි හිටියේ
කොඳුර කොඳුර ඔබයි මමයි විතරයි හිටියේ//

X

MadhuraGeet

Touch through music

## 037 - මම නම් ආසයි - සනත් නන්දසිරි

මම නම් ආසයි අහන්න නයනා ඉස්සර වාගේ ඔබේ මුවින්
දෙනෙත පියාගෙන කියන්න මුමුණා එක වදනක් හෝ කෝල ලෙසින්
වෙන කවුරුත් නැහැ අහගෙන ඉන්නේඉර හද පමණයි කවදත් උන්නේ
මම නම් ආසයි අහන්න නයනා ඉස්සර වාගේ ඔබේ මුවින්

ඉඳුල් මගේ නෙත මුලින්ම දුටුදා මා හා හිනැහුනු අහිංසකාවිය
අදත් එදා මෙන් දකින්න ඇත්නම් මට පෙම් කල මුදු නිසංසලාවිය
මා ආගන්තුක ලෙසද පෙනෙන්නේ පුරුදු හඬින් ඇයි හිනා නොවන්නේ
මම නම් ආසයි අහන්න නයනා ඉස්සර වාගේ ඔබේ මුවින්

පාසල් කාලය ඔහේ ගෙවෙද්දෙන් ලෝකය යනතක ගමනේ යද්දෙන්
පුංචි දැරිය යුවතියක වුනාදෙන් මගේ බොලඳ හිත මට තිබුනාදෙන්
ලොවට බයේ ඇයි ජීවත් වෙන්නේ දුරින් නොවේ ඔබ ලඟයි හිඳින්නේ

මම නම් ආසයි අහන්න නයනා ඉස්සර වාගේ ඔබේ මුවින්
දෙනෙත පියාගෙන කියන්න මුමුණා එක වදනක් හෝ කෝල ලෙසින්
වෙන කවුරුත් නැහැ අහගෙන ඉන්නේඉර හද පමණයි කවදත් උන්නේ
මම නම් ආසයි අහන්න නයනා ඉස්සර වාගේ ඔබේ මුවින්

X

038 - ආදර සැමරුම් කැටිවූ - සනත් නන්දසිරි

(ආදර සැමරුම් කැටිවූ නෙතු කඳුලින් මුතු පබුලින්
නිමා කලෙමි සිහිවටනය යමුනා තීරේ, යමුනා තීරේ)//
එවන් නිමල මැදුර බලා වඩින්න දේවියේ
මහද අඳුරු ලෙන අතහැර වඩින්න දේවියේ

(දහසක් මිණි මල් ලියකම් පෙම පිදුවූ රන් කැටයම්)//
යමුනාවේ තරඟ මතින් මට පිලිබිඹු වේවා
චමත්කාර අතීත සඳ යලිත් ජනිත වේවා

ආදර සැමරුම් කැටිවූ නෙතු කඳුලින් මුතු පබුලින්
නිමා කලෙමි සිහිවටනය යමුනා තීරේ, යමුනා තීරේ
එවන් නිමල මැදුර බලා වඩින්න දේවියේ
මහද අඳුරු ලෙන අතහැර වඩින්න දේවියේ

(අපගේ පෙම් පුරාවතින් දෙරණ හෙලූ කඳුලු ගලා)//
මැදුරක කිරි ගරුඬ පවුරු පබා කැලුම් දේවා
සනාතනවූ පෙම් සටහන් එහි සිතුවම් වේවා

(ආදර සැමරුම් කැටිවූ නෙතු කඳුලින් මුතු පබුලින්
නිමා කලෙමි සිහිවටනය යමුනා තීරේ, යමුනා තීරේ)//
එවන් නිමල මැදුර බලා වඩින්න දේවියේ
හෙට දින මා එනතුරු එහි නිදන්න දේවියේ

x

## 039 - කල්පනා ලොව මල් වනේ - අබේවර්ධන බාලසූරිය

කල්පනා ලොව මල් වනේ සිහින රජ දහනේ
ආදරේ … ආදරේ

නීල අහසේ තාරකා සේ ඈ නුවන් දල්වා බලන්නී
ප්‍රේමයේ මායා දැලින් මා සිත් නුවන් බඳවා තබන්නී

කල්පනා ලොව මල් වනේ සිහින රජ දහනේ
ආදරේ … ආදරේ

මා වටා සහසක් යුගත් පා ඈ රැවින් පිලිරූ මැවීලා
පාව යයි මුලු ජීවිතේ සුදු මීදුමින් දැවටී එතීලා

කල්පනා ලොව මල් වනේ සිහින රජ දහනේ
ආදරේ … ආදරේ

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

040 - බඹරෙකු හැඬුවා - අබේවර්ධන බාලසූරිය - නිරංජලා

බඹරෙකු හැඬුවා මලක් ලඟදි බඹරෙකු හැඬුවා
හැඬුවා ... මලක් ලඟදි බඹරෙකු හැඬුවා

ඇගේ කඳුලු ඇති ඒ බඹරිඳු දැක
හඬන්නෙ ඇයිදෝ මල ඇසුවා මල ඇසුවා

ලන්ද එහා ඇති ඕවිට පාමුල කේතකි මල මට බහ දුන්නා
කවුදෝ ඇවිදින් එමල නෙලූ බව ඉකිබිඳිමින් බඹරිඳු කීවා

ඇගේ කඳුලු නොව හිතේ කඳුලු දැක
ඇයටත් හරියට දුක හිතුනා
එහෙනම් මා වෙත පියඹා එන්නැයි
සෙනෙහෙ සිතින් ඒ මල කීවා

බඹරෙකු හැඬුවා මලක් ලඟදි බඹරෙකු හැඬුවා
හැඬුවා ... මලක් ලඟදි බඹරෙකු හැඬුවා

X

## 041 - ඇසේ මධුර ජීවනයේ ගීතා - ආනන්ද සමරකෝන්

(ඇසේ මධුර ජීවනයේ ගීතා නාමු අමා දහරේ)//
(තාරපතී අහසේ සුදිලේවී දීප්ති විහිදමිනේ)//
රම්‍ය සොබාධර්මේ //
(ඇසේ මධුර ජීවනයේ ගීතා නාමු අමා දහරේ)//

(රිදී කඳන් සේ ජල ධාරාවෝ
පෙනේ පෙනේ හැලි හැලි කඳු මුදුනේ)//
(භෘංගයෝ නද දිදී හැසිරෙතී)//
සෝබන මල් ගොමුවේ //
(ඇසේ මධුර ජීවනයේ ගීතා නාමු අමා දහරේ)//

(හිඳ මේ ගං තීරේ මඳ වේලා)//
(පීනමු ඒ අම ගී දහරාවේ)//
(ඔබයි සාගරේ මමයි තරංගා)//
ඒ මත සැනසෙන්නා //
(ඇසේ මධුර ජීවනයේ ගීතා නාමු අමා දහරේ)///

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 042 - බැස සීතල ගඟුලේ - ආනන්ද සමරකෝන්

(බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ)// හඳපානේ.. හඳපානේ
බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ
(හීතල ජලය අගෙයි ගත සිත පිනයි පිනයි)//
(පොඩි පොඩි රැලිද නගී රාසි රාසි පෙණගැසී ගැසී)//
හඳපානේ හඳපානේ බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ
(සමනල කන්ද පෙනෙයි කදිමට හඳ එලියේ)//
(ඉනිකට පදිමු නගෝ නාමු නාමු ගිලෙමින ජලයේ)//
හඳපානේ හඳපානේ බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ
(මානෙල් ඕලු නෙලුම් පිපිලා යසයි යසයි)//
(නෙලමින පීනමුකෝ ප්‍රීති ප්‍රීති පෙමින බෝ ලෙසේ)//
හඳපානේ හඳපානේ බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ
(ජලයේ ගිලී මෙසේ පිරිසිදු වෙමුකො නගෝ)//
(අලුයම වඩින ලෙසින සාධු සාධු ඒ මුණි සිරිපා)//
හඳපානේ හඳපානේ බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ
(නෙලමින මේ කුසුමන් සිරිපා වඳිමු බැතින්)//
(එසමන් දෙව් පිහිටෙන් යාමු යාමු අපි හිමිදිරියේ)//
හඳපානේ හඳපානේ බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ
(හිඳිමුද මෙහිම නගෝ පොඩි පැල්පතක් තනා)//
(සැමදා වඳිනට හැක සාධු සාධු ඒ මුණි සිරිපා)//
හඳපානේ ....

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 043 - පොඩි මල් එතනෝ - ආනන්ද සමරකෝන්

පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
කාට ඇසෙන්නද ලදේ කදිමට කවි කියන්නේ
හිඳ තනියම ගංතෙරේ පොඩි මල් එතනා සුරතල් එතනා
පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
අතු අග අර සිටින ඒ රණ ගිරවිද නැටෙන සේ
කියන්නේ මේ කවි මේලෙසේ නිකමට හිතුනා නිකමට හිතුනා
පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
හා හා ඔය බොරු එපා දන්නවා මම ඔය උපා
මට අහගන ඉන්න නේ කවිය කියන්නේ සුරතල් එතනා
පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
අහසේ හිරු බැස යතේ කුරුලෝ ඉගිලී යතේ
ගඟ දිය සුලඟින් ඇදෙයි බලන්න මහිමේ බලන්න මහිමේ
පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
හැබැහැට ලස්සන තමයි එතනගෙ රුව කදිම මැයි
මුහුණ පොසොන් හඳ වගෙයි රැස් විහිදෙන්නා රැස් විහිදෙන්නා
පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
මගෙ හැඩ මොකටද අනේ නොකියනු දැන් එය අනේ
බලන්න හිරු ගිලුනනේ අඳුරත් වැටුනා අඳුරත් වැටුනා
පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
පොඩි එතනා බය හැඩයි සඳ අර අහසේ නැගෙයි
මා නිතරම ඔබ ලඟයි මගෙ මල් එතනෝ මගෙ මල් එතනෝ
පොඩි මල් එතනෝ සුරතල් එතනෝ
පීනමු පෙම් සාගරේ එතෙරට යමු දෙව්පුරේ
නෙක සිරිසැප විඳිමිනේ (ප්‍රේමෙන සැමදා)// X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 044 - රත්නදීප ජන්ම භූමි - අමරදේව

(රත්නදීප ජන්ම භූමි ලංකාදීප විජය භූමි)//
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි

ආදි සිංහලේ වීර මීමුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි

(මානික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී) // ඇත්තෙ ඒ අභීත දූ පුතුන්
(ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ)// ජීවිතේ පුදා හෙළූ ලේ කඳයි

(සින්දූපමාන වැව් තලා මතින් ඇදී)// පද්ම රේණුයෙන් සුගන්ධ වී
(රන් කරල් නමා හමා සිත් ප්‍රබෝධයෙන් පුරා)//
එන්නෙ උන් හෙළූ ප්‍රාණ වායුවයි

(ගංගා තරංග රාව දී රිදී වනින්)// මල් පිපී කුළෙන් කුළේ හැපී
(ගායනා කරන්නේ ආකාසයේ නැගී)// වීරයින්ගෙ ඒ යශෝ ගීතයයි

(රත්නදීප ජන්ම භූමි ලංකාදීප විජය භූමි)//
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි
ආදි සිංහලේ වීර මීමුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි

x

## 045 - මල් වට්ටියක් - සුනිල් එදිරිසිංහ

(මල් වට්ටියක් වෙන්දේසියක්
පන්සලේ ලොකු පින්කමක් බුදු හිමියනේ
ඔබ පුදන්නට ගමේ දෙපිලක තරගයක්) // මල් වට්ටියක්

පිනට දහමට නුහුරු අත හිත දුකට පිහිටට නොහිත නෙත සිත
තරගයට වැද උනුන් සිත පරදා මහන්තත්වය රකීවී

මල් වට්ටියක් වෙන්දේසියක්
පන්සලේ ලොකු පින්කමක් බුදු හිමියනේ
ඔබ පුදන්නට ගමේ දෙපිලක තරගයක් මල් වට්ටියක්

තරග ඇති මුත් ලොවේ දස අත
තරග කුමටද බුදුන් පිදුමට
සතර රියනක තනිව සැතපෙනදා
තරගයද කෙළවරක් වේ

(මල් වට්ටියක් වෙන්දේසියක්
පන්සලේ ලොකු පින්කමක් බුදු හිමියනේ
ඔබ පුදන්නට ගමේ දෙපිලක තරගයක්)//
මල් වට්ටියක් වෙන්දේසියක්

x

046 - මිනිසෙකු පිට නැගි - සුනිල් එදිරිසිංහ

(මිනිසෙකු පිට නැගි අසරුවෙකී
ඒ බර ගෙයි වහලට බරකී
පාන්දරින් පැරදුනු ඒ මිනිහා
හැන්දෑවෙත් අසුපිටට නගී) //

හෙට මම ගෙදරට සුර සැප දෙනවා
අද රෑ ලුණු මිරිසෙන් ගත වෙනවා
කාසිමල්ල සතෙකුගෙ පිට යනවා
දූ දරුවන් පැදුරේ නිදියනවා

මිනිසෙකු පිට නැගි .../

ඉරණම් විසඳුම සතෙකුට දෙනවා
තිරිසනෙකුට මිනිසෙකු පරදිනවා
දරුවන් බිරිඳත් ගිනි උගුලනවා
සිහිනෙන් නුඹ තව ගෙවල් හදනවා

මිනිසෙකු පිට නැගි ...//

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

047 - දෑස නිලුපුල් තෙමා - ගුණදාස කපුගේ

දෑස නිලුපුල් තෙමා - කඳුළු මුතුවැල් සලා
දෙතොල සුසුමින් පුරා ඉකිබිඳ
(හඬනු මල් මාලියේ) // x2

(නිහඬ හදවත් පොතේ ලියවුනු
සොඳුරු ගී වැල් නැතේ මා තැනු) //
ඔබේ කඳුලැලි මා සිතේ
(නිබඳ පදවැල් ඇදේ )//..

දෑස නිලුපුල් තෙමා - කඳුළු මුතුවැල් සලා
දෙතොල සුසුමින් පුරා ඉකිබිඳ
(හඬනු මල් මාලියේ) //

(පබලු මිනිමුතු නැතේ මා සතු
කඳුළු මුතු ඇත ඔබේ මා පැතු) //
තුෂර පිණි ලෙස මල් මතේ
(කඳුළු කොපුලේ රැදේ)//

දෑස නිලුපුල් තෙමා - කඳුළු මුතුවැල් සලා
දෙතොල සුසුමින් පුරා ඉකිබිඳ
(හඬනු මල් මාලියේ) //

x

## 048 - සීතල සඳ එළියේ - ගුණදාස කපුගේ

සීතල සඳ එළියේ - පිපුණු සුවඳ මලේ
නැඹුල් සුවය පැතූ - (බඹරෝ නුඹ නාඩන්) // x2

(සඳළු තලාවේ මුණින් තලා වී
ඇත බලාගෙන කඳුළු සලන්නී) //
පරසතු මල් මකරන්ද සුවඳ මැද
(බඹරෝ නුඹ නාඩන්)//

සීතල සඳ එළියේ .../

(සදාහරිත වන රේඛා මැද්දේ
මලානිකව ගලනා සඳ එලියේ) //
රෑ සිහිනෙන් මුව ගෑ අඳුනක් දැක
(බඹරෝ නුඹ නාඩන්)//

සීතල සඳ එළියේ .../

x

049 - දෙතොල නොකීදේ - ගුණදාස කපුගේ

දෙතොල නොකීදේ දෙනෙතේ කියැවෙනවා
වසන් කරන හිත මුහුණේ ලියැවෙනවා
නංගිගෙ පාමුල ඉර හඳ තියලා
ආදර හිත ළඟ කවුරුද මුවාවුණේ

(හැඩරුව බලලා කැඩපත වෙහෙසන්නේ
පුංචි හිතේ පොඩි මදු මල් පිපිලාදෝ)//
ගෙදර බුදුන් මුව උදානයක් වූ
නංගිගෙ හිත ළඟ කවුරුද මුවාවුණේ

දෙතොල නොකීදේ ... /

(බාල බොළඳියේ ඉස්සර සුරතල් වූ
කවට සිනා කෙළි සඟවා තැබුවාදෝ)//
වසන්තයට පෙර කැකුළට ළංවී
නංගිගෙ හිත ළඟ කවුරුද මුවාවුණේ

දෙතොල නොකීදේ ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

050 - සුදු නැන්දා ඇයි - ගුණදාස කපුගේ

සුදු නැන්දා ඇයි ගේ දොර වැහුවේ
මාමණ්ඩී මට ඇයි මඟ හැරියේ
හීන් හඬට ඉකි බිඳුම් ඇහෙන්නේ
(හීන් නඟා ඇයි ගේ මුල්ලේ)//

වෙනදා ඉදිකඩ අද මට හරස් වෙලා
වයිරා දොරකඩ නොබලයි ඉව අල්ලා
රිදී පොටක් හංගාගෙන ආවා
(හීන් නගේ නුඹ නෑ දන්නේ)//

සුදු නැන්දා ... /

තටු පොරවා ගෙන සැලයා කුඩුවෙලා
කනප්පුවෙන් පැන හෙප්පුව බිම වැටිලා
පහන් පැළට අද පරමල් වැඩලා
(ගලේ විහාරෙත් ගොලු වීලා)//

සුදු නැන්දා ... /

x

## 051 - අභිසාරිකාවන්ගේ - ගුණදාස කපුගේ

අභිසාරිකාවන්ගේ උන්මාද නෙතු අතරේ
අයාලේ ගිය ජීවිතේ ඔබෙනි පල ගැනුනේ
අභිසාරිකාවන්ගේ

රාග ගිනි ජාලාවේ ප්‍රේමයේ උණුසුම් සුසුමේ
වෙනස ඔබෙනි දැනුනේ
අයාලේ ගිය ජීවිතේ ඔබෙනි පල ගැනුනේ
අභිසාරිකාවන්ගේ

ආදරේ යන වදනේ මනු ලොවේ මිනිසත් භවයේ
මහිම ඔබෙනි දැනුනේ
අයාලේ ගිය ජීවිතේ ඔබෙනි පල ගැනුනේ

අභිසාරිකාවන්ගේ උන්මාද නෙතු අතරේ
අයාලේ ගිය ජීවිතේ ඔබෙනි පල ගැනුනේ
අභිසාරිකාවන්ගේ

x

052 - ස්වර්ණ විමානෙට - අමරදේව

ස්වර්ණ විමානෙට එහා ලෝකයෙන්
ඔරුවක ගොඩවී මා එනවා
ස්වර්ණ වර්ණ රන් එළිය දකින්නට
දළ රැළි මත නැගිලා එනවා
ස්වර්ණ විමානෙට එහා ලෝකයෙන්

(රැල්ලේ පාවී වැල්ලේ බිහිවන
සංගීතෙන් අප හමුවෙනවා)//
(සැන්දෑ යාමේ පෙම් රස කලතා)//
සාගර ජලකඳ නැලවෙනවා
ස්වර්ණ විමානෙට එහා ලෝකයෙන්

(මුතු බෙලිකටු කිරි කවඩි සොයාගෙන
ඔරුවට ගොඩවී මා එනවා)//
(මගේ අනාගත පැතුම් විමානෙට)//
සෙනෙහස පොදි බැඳ ගෙන එනවා

ස්වර්ණ විමානෙට එහා ලෝකයෙන්
ඔරුවක ගොඩවී මා එනවා
ස්වර්ණ වර්ණ රන් එළිය දකින්නට
දළ රැළි මත නැගිලා එනවා
ස්වර්ණ විමානෙට එහා ලෝකයෙන්

x

053 - ඉරහඳ පායන ලෝකේ - අමරදේව

ඉරහඳ පායන ලෝකේ - අලෝකය අතරේ
සැප දුක සමබර වේ
මේ ජීවන කතරේ - මේ ජීවන කතරේ
සැප දුක සමබර වේ

(උකුලේ ළමැදේ සමබර උසුලන)//
ගැමි ලිය යන ගමනේ - මුදු බඳ ලෙළවෙන සේ
(කඳුවැටි ගංගා සාගර එකසේ)//
පොළවට සමබර වේ
මේ ජීවන කතරේ //
සැප දුක සමබර වේ

(වැඩිවන ආශා මැඬලන වේගේ)//
ජීවන මඟ කැළඹේ - එකම රසමුසු වේ
(මහ වනවදුලේ වනවිල් අතරේ)//
පියුම් පිපී සැනහේ
මේ ජීවන කතරේ //
සැප දුක සමබරවේ

ඉරහඳ පායන ලෝකේ - අලෝකය අතරේ
සැප දුක සමබර වේ

x

054 - අහස උසට නැග ගියාට - ගුණදාස කපුගේ

(අහස උසට නැග ගියාට නැහැනෙ අහසෙ රැදෙන්නේ
අහසෙ මාළිගා සැදූවට අපි පොළවෙයි සිටින්නේ)//

(ලඹ කැටයේ අත් වාරුව බිත්ති දිගේ නගින්නේ
බිත්තිය ඉහලට යනකොට අපි පොඩියට පෙනෙන්නේ)//

(අහස උසට නැග ගියාට නැහැනෙ අහසෙ රැදෙන්නේ
අහසෙ මාළිගා සැදූවට අපි පොළවෙයි සිටින්නේ)//

(සිමෙන්ති කඳුලින් දියකර සත් මහලයි තනන්නේ
පලන්චියේ කිරි කිරියයි අපේ දූකට හඬන්නේ)//

(අහස උසට නැග ගියාට නැහැනෙ අහසෙ රැදෙන්නේ
අහසෙ මාළිගා සැදූවට අපි පොළවෙයි සිටින්නේ)//

X

055 - සැන්දෑ අහසේ - දයාරත්න රණතුංග

(සැන්දෑ අහසේ ඉරට මුවාවෙන්
කාලය කවුළු දොරින් මිය යනවා) // සැන්දෑ අහසේ

ඈත අතීතෙන් පියවර නගමින්
කණාවැල අල්ලන් කවුදෝ එනවා
බලාපොරොත්තුව ළයට තුරුළු වී
ඈ එන පෙර මඟ බලා හිඳිනවා

සැන්දෑ අහසේ ඉරට මුවාවෙන්
කාලය කවුළු දොරින් මිය යනවා සැන්දෑ අහසේ

දුකට මිහිර දෙන පාළුව තනිකම
මා වට දැවටී කඳුළු සලනවා
අදත් එදා මෙන් නුපුරුදු සුවඳක්
ඒ අතරේ මා වෙතට ඇදෙනවා

(සැන්දෑ අහසේ ඉරට මුවාවෙන්
කාලය කවුළු දොරින් මිය යනවා) // සැන්දෑ අහසේ

X

# 056 - නුඹේ සිතට - සුනිල් එදිරිසිංහ

නුඹේ සිතට පුන්සඳ පායලා වගේ
සිනා සිසී මල් පිපුණා දෙතොල දිගේ
එදා නැගුණු ආදර කැක්කුමට මගේ
ජාති ජාති නුඹ මට වාසනා නගේ

අරුංගලේ දිස්නය ඇස් දෙකට අගේ
මාල පොටේ මුතු අමුණා මුවග අගේ
දෙපෝදාට අහසේ තරු රෑන අගේ
ආලසිතක් බැඳුනයි රන් රුවට හොරේ

නුඹේ සිතට ... /

නළල් තලට මුතු තැල් පත කිමද දගේ
අතැඟිල්ලට රන් මුදුවක් නොවෙද අගේ
ලතැවිල්ලට මංගල පෝරුවක් වගේ
සැනසිල්ලට දුරු රටකට යමුද නගේ

නුඹේ සිතට ... /

x

057 - මගෙ අමල් බිසෝ - සුනිල් එදිරිසිංහ

(මගෙ අමල් බිසෝ දොර අරින්නෙපා
හොඳ පරිස්සමෙන් හිටපන්
මම දීපන්කරේ ළතැවුලෙන් මෙසේ
නුඹ මුදු කරේ තනියෙන්) //

යස ඉසුරු අරන් සුදු මහත්වරුන්
එරොප්පෙ ඉඳන් ඇවිදින්
මුදු බැලුම් හෙළයි ළංවෙන්න බලයි
නුඹ නොදැක්ක සේ ඉඳපන්

මගෙ අමල් බිසෝ ... /

ඇඳි නේක ඇඳුම් සුදු නෝන වරුන්
ගෙට එබී බලයි හොරැහින්
මගෙ පුංචි එවුන් ටික ලඟට කරන්
නුඹ හෝදිසියෙන් ඉඳපන්

මගෙ අමල් බිසෝ ... //

x

058 - සසර වසන තුරු - අමරදේව

(සසර වසන තුරු
නිවන් දකින තුරු) //
පින් කෙත හෙළ රන් දෙරණේ
යළි උපදින්නට
හේතු වාසනා වේවා හේතු වාසනා

(රත්නමාලි සෑ කිරණයි - මහ බෝ සෙවණයි
තිසා වැවයි සීගිරියයි - මගේ උරුමයයි) //

(සසර වසන තුරු
නිවන් දකින තුරු) //
පින් කෙත හෙළ රන් දෙරණේ
යළි උපදින්නට
හේතු වාසනා වේවා හේතු වාසනා

X

059 - උඬගු ලියන් - නන්දා මාලිනී

(උඬගු ලියන් ගොතා බඳින
නීල වරල සරසන්නට
මා පිපුනේ නැත මේ දෙරණේ)//

(හිස් මිනිසුන් කුස් පුරවන
සිත් පිනවන බස් දොඩවන)//
බොජුන් මේස මත සුවඳ හමන්නට
මා පිපුනේ නැත මේ දෙරණේ

උඬගු ලියන් ගොතා බඳින
නීල වරල සරසන්නට
මා පිපුනේ නැත මේ දෙරණේ

(රට වෙනුවෙන් සටනට වැද දිවිදුන්
රණ විරුවකුගේ අවසන් ගමනට)//
(යන මහ ජනතා පා දූවිල්ලෙන්)//
තැලී පෙලී සැනහී මිය යන්නෙමි

(මගේ පරම පැතුම එයයි)///
එමඟට මා විසිකරන්න

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

060 - ලංකා ලංකා - සුනිල් ශාන්ත

ලංකා ලංකා පෙම්බර ලංකා පිනවමු ඔබ ලංකා
හොබවමු ඔබ ලංකා දිවි දී සුරකිමු ඔබ ලංකා

බලිතරු රාවණ ගැමුණු විජයබා නිරිඳුන් ලද ලංකා
පුලතිසි දැමි සිරි රහල් කුමරුතුඟු පඬුවන් ලද ලංකා
විදූ සක්විති මහ පැරකුම් කිවිසුරු කිවියන් ලද ලංකා
ඔබ රැකුනොත් ලෝ කුඹුවද අපහට සීත ගඟුල ලංකා

ලංකා ලංකා පෙම්බර ලංකා පිනවමු ඔබ ලංකා
හොබවමු ඔබ ලංකා දිවි දී සුරකිමු ඔබ ලංකා

ඔබ හට අත පොවනට උන් මුන් හට ඉඩ නොතබමු ලංකා
අවහොත් මෙහි උන් ලුහුබඳවා ගොලු මුහුද ගෙවමු ලංකා
ගොඩ දියෙ අහසේ හැම තැන ඔබගේ නම කියවමු ලංකා
අවසන ඔබටම පොහොරට මේ කය මෙහිම හොවමු ලංකා

ලංකා ලංකා පෙම්බර ලංකා පිනවමු ඔබ ලංකා
හොබවමු ඔබ ලංකා දිවි දී සුරකිමු ඔබ ලංකා

X

## 061 - අපි ඔක්කොම රජවරු - වික්ටර් රත්නායක

අපි ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ
තුන් සිංහලයම නෑදෑයෝ
අපි ඔක්කොම පියවරු ඔක්කොම මව්වරු
(තුන් සිංහලයම දූ දරුවෝ)//

(ජයදද බන්දා - සිරිදූව කැන්දා)// රුපු සෙන් ඔද තෙද සින්දා
(හද අරවින්දා - කර සිරි නන්දා)// (පරගැති සිත ගත බින්දා)//

අපි ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ
තුන් සිංහලයම නෑදෑයෝ
අපි ඔක්කොම පියවරු ඔක්කොම මව්වරු
(තුන් සිංහලයම දූ දරුවෝ)//

(හිස මල් පිපුනා - හසරැල් නැගුණා -)// හද සෝ ගිනි දැල් නිවුණා
(නෙතු කැන් දිලුනා - සිතුවැල් බැඳුනා -)// (ජය මංගල ගී ගැයුණා)//

අපි ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ
තුන් සිංහලයම නෑදෑයෝ
අපි ඔක්කොම පියවරු ඔක්කොම මව්වරු
(තුන් සිංහලයම දූ දරුවෝ)//

X

## 062 - මේ සිංහල අපගෙ රටයි - නන්දා මාලිනී

(මේ සිංහල අපගෙ රටයි)// අප ඉපදෙන මැරෙන රටයි
අප හද පණ ගැහෙන රටයි මුළු ලොව ඒ රටට යටයි

(අහස සිඹින ගිරි කඳුරු)// පොළව තෙමන වැව් සයුරු
මුහුද අවට බැඳි පවුරු මෙරට අසිරි සිරි එයුරු

මව් බිම වෙනුවෙන් පොරණේ දිවිදුන් විරු දරුවන්නේ
ලේ වලිනුයි මේ දෙරණේ මිණි කැට මුතුකැට මැවුණේ

(සමනොල ගිරි වලලු බිමේ)// මුනි සිරිපා පිපෙන හිමේ
සම කරුණා ගුණ මහිමේ අප උපතින් ලද උරුමේ

මේ සිංහල අපගෙ රටයි අප ඉපදෙන මැරෙන රටයි
අප හද පණ ගැහෙන රටයි මුළු ලොව ඒ රටට යටයි

X

## 063 - යාලු බාල සඳේ - සෝමතිලක ජයමහ

යාලු බාල සඳේ කඳු මුදුනේ මොකද කරන්නේ
මා දෙසම නොවෙද නෙත් නොසලා බලා සිටින්නේ
ඇය සිටින තැනට මටත් හොරා මා ගෙනයන්නේ
ඇගෙ නළල් තලේ අහස වලා පෙලේ අඳින්නේ - යාලු බාල සඳේ

දුරක වෙසෙන මගෙ තනිකම
අහසෙ සිටින නුඹට පමණි පෙනුනේ යාලු
විරහ තාපයේ දැඩිකම
සිත් පිත් ඇති අයටත් නෑ දැනුනේ යාලු

යාලු බාල සඳේ .../

ඇෑ දැකුමට නලියන සිත
ඇගෙ නළලේ හැඩරුව දැක සැනසෙයි යාලු
ඇගේ රුවින් බිඳුවක් ගෙන
හෙටත් රෑට කඳු මුදුනේ හිනැහෙනු යාලු

යාලු බාල සඳේ .../

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 064 - අඳුරු කුටිය තුල - වී. එම්. ජයරත්න

අඳුරු කුටිය තුල දොරගුලු ලාගෙන
ගයන ගීතිකා යදින යාතිකා
(දෙවියන් හට නෑසේ)//
පොලව කොටන තැන පාර කපන තැන
ගිණියම් අව්වේ මහ වරුසාවේ
(දෙවියෝ වැඩ ඉන්නේ) //
(බලන් කඩතුරා හැර දෑසේ) //

සිනිඳු සුවැති සළු සිරසින් හැරදා
දුවිලි මඩ වැකි පිළි ගත පලදා
දෙවියන් රුව දක්නට හැක්කේ ...

අඳුරු කුටිය තුල ...

කුසුම් සඳුන් දුම් සුවඳින් වැලකී
ගත නැගි දාඩිය සුවඳින් සැරසී
දෙවියන් හා එක්විය හැක්කේ ...

අඳුරු කුටිය තුල ...

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

065 - සිරි බුද්ධ ගයා විහාරේ - රුක්මනී දේවී

(සිරි බුද්ධ ගයා විහාරේ වදින්නෙමු මෝක්ෂ පතාලා) //
(ශාක්‍ය තිලෝනා වැඩ සිටි එදිනා)//
(මරගනන් පරදාලා ..)//
බුද්ධ ගයා සිරි බුද්ධ ගයා විහාරේ වදින්නෙමු මෝක්ෂ පතාලා

(ශ්‍රී මහා බෝධී වෙත සැදී ඒ විදු රසුනේදී මුණි රාජා) //
(ආ දස බිම්බර මාර සේනා)//
(පෙරුම් බලෙන් පරදාලා ..)//
බුද්ධ ගයා සිරි බුද්ධ ගයා විහාරේ වදින්නෙමු මෝක්ෂ පතාලා

(ප්‍රාතිහාර්ය පෑ දස බලධාරී)//ජයබිම මේ විශාලා
ප්‍රාතිහාර්ය පෑ දස බලධාරී ජයබිම මේ විශාලා
ශාසන ආලේ ඇති ලෝ වාසී ශාසන ආලේ ශාසන ආලේ
ශාසන ආලේ ඇති ලෝ වාසී
(භව දුක නසනා සේමා)//
වදින්නෙමු මෝක්ෂ පතාලා ...
බුද්ධ ගයා සිරි බුද්ධ ගයා විහාරේ වදින්නෙමු මෝක්ෂ පතාලා
සිරි බුද්ධ ගයා විහාරේ වදින්නෙමු මෝක්ෂ පතාලා

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

066 - සැඳෑ අඳුර ලොව - සෝමතිලක ජයමහ

(සැඳෑ අඳුර ලොව ගලන වෙලාවට
කවුලු පියන් පත් වැසෙන වෙලාවට)//
දහසක් දෝම්නස් සිහින පවුරු මැද
තනිවුන ඔබෙ සුසුමන් සෙමින් විත් මගෙ සවනත පාරයි X2

(තෙරක් නොමැති සිතුවිලි සයුරක් මැද
සරන විටදි රැය ගෙවෙන තුරාවට)//
මහද සෙනෙහෙ ඔරුවේ නැගී ඔබ
එතෙරවන්න නිබඳේ නිදිලොව වෙත එතෙරවන්න නිබඳේ

සැඳෑ අඳුර ලොව ගලන වෙලාවට
කවුලු පියන් පත් වැසෙන වෙලාවට

(නිමල පැතුම් සපුරා ගෙන හද තුල
සිහින ලොවෙන් නෙත හැරෙන වෙලාවට)//
අරුණළු නැගෙන පැයේ කුසුමක් වෙමි
ජීවන මල් ගොමුවේ ඔබෙ ආදර ජීවන මල් ගොමුවේ

(සැඳෑ අඳුර ලොව ගලන වෙලාවට
කවුලු පියන් පත් වැසෙන වෙලාවට)//
දහසක් දෝම්නස් සිහින පවුරු මැද
තනිවුන ඔබෙ සුසුමන් සෙමින් විත් මගෙ සවනත පාරයි
සෙමින් විත් මගෙ සවනත පාරයි
X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 067 - පියමන් කෙරුවෙමු - සෝමතිලක ජයමහ

පියමන් කෙරුවෙමු මහ වෙල් මැද්දෙන්
පෙම් බස් දෙඩුවෙමු උයන් කොනක හිඳ
ශිල්ප උගත්තෙමු නැණ ලැබ ගත්තෙමු
(දෙපා වාරු නැත ඔබ හැර යන්නට)//

(නිල් තණ පලසෙහි ගැටුන දෙපාවයි
කෝල හැඟුම් කෙලි කවට සිනාවයි)//
මල් නැටුමයි කලගෙඩි නැටුමයි
(මගේ දෑස තුල යලිත් ඇදේවිද)//

පියමන් කෙරුවෙමු .../

නෙත කඳුලින් හස කැනින් මුවා කල
සොඳුරු පැතුම් පුරවා මනමත් කල
මගෙ කෙලිලොල් විය ගෙවුනු වගයි
(මා හැදූ පාසල් මවුනි දයාදර)//

පියමන් කෙරුවෙමු .../

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 068 - වන්දනාවේ යමු - එම්. කේ. වින්සන්ට් - නිර්මලා

(වන්දනාවේ යමු පේවීලා තිසරණ සීලේ වඩින්ටා වඩින්ටා
රම්‍ය අටමස්ථානේ) //
දේව පුරේ සේ සිරිදේ // පූජනීය ඒ නගරේ //
පූජා දෙමු නිර්වාණේ පතා මෙ පෝදා//
ත්‍රෛලෝනා මුනි රාජා දේවි සිරි මහ බෝධී
දිලේ ශ්‍රී// - විසල් අනුරා නගරේ - වන්දනාවේ .../

ගාමිණී රාජා සැදූවේ// රත්නමාලි චෛත්‍ය රජා//
අභයගිරිය ආදි ශුද්ධ අඨමස්ථානේ//
ත්‍රෛලෝනා මුනි රාජා දේවි සිරි මහ බෝධී
දිලේ ශ්‍රී// - විසල් අනුරා නගරේ - වන්දනාවේ .../

අජරාමර දිනූ නිමල් // ගුණ සාගර තිලෝ ගුරු //
සිහිකරලා බැතිනේ පුදා මෙපෝදා//
ත්‍රෛලෝනා මුනි රාජා දේවි සිරි මහ බෝධී
දිලේ ශ්‍රී// - විසල් අනුරා නගරේ - වන්දනාවේ .../

මල් සෝදා සුවඳ ජලෙන්// චන්දන කල්කුර දූමෙන්//
පූජාදී පතමු නිවන් ශ්‍රී සම්පත් දී /// ශ්‍රී සම්පත් දී

x

069 - දම්පාටින් ලා සඳ - ගුණදාස කපුගේ

දම්පාටින් ලා සඳ බැස යනවා ආකාසේ රන්වන් පාටයි
සමුගෙන යන්න මගෙන් තව මොහොතයි (නොදොඩා ඉන්නේ ඇයි ..)//
දම්පාටින් සඳ මුහුණ පෙනෙනවා වෙන්වී යන මොහොතක් නෑගේ
දෑසට ලංව තවත් මේ මොහොතේ (ගොළුවී ඉන්නෙම් මං ..)//

(හෙවනැලි නොමැකේ නම් එලිය කලු නොවේ නම්)//
බිත්ති පුරා ඔබෙ සෙවනැලි ඇන්දේ තනිය මකාගන්නයි
එනතුරු සොයා මගේ සෙනෙහස මතුදා

දම්පාටින් ලා සඳ බැස යනවා ආකාසේ රන්වන් පාටයි
සමුගෙන යන්න මගෙන් තව මොහොතයි (නොදොඩා ඉන්නේ ඇයි ..)//
දම්පාටින් සඳ මුහුණ පෙනෙනවා වෙන්වී යන මොහොතක් නෑගේ
දෑසට ලංව තවත් මේ මොහොතේ (ගොළුවී ඉන්නෙම් මං ..)//

(රෑකල දිගු වේනම් ලාසඳ නොමැකේ නම්)//
නෙලුම් පතක රැඳි පිණි බිඳුවක් සේ ළමැද තලා යහනේ ඉන්නම්
පමාවෙලා හිරු නැගෙන තුරා

දම්පාටින් ලා සඳ බැස යනවා ආකාසේ රන්වන් පාටයි
සමුගෙන යන්න මගෙන් තව මොහොතයි (නොදොඩා ඉන්නේ ඇයි ..)//
දම්පාටින් සඳ මුහුණ පෙනෙනවා වෙන්වී යන මොහොතක් නෑගේ
දෑසට ලංව තවත් මේ මොහොතේ (ගොළුවී ඉන්නෙම් මං ..)//

X

## 070 - කවුරුන්ද ඔබ මගේ - සුනිල් එදිරිසිංහ

(කවුරුන්ද ඔබ මගේ - කවුරුන්ද මා ඔබේ)//

(දෙතොල් සලා මුදු සිනා නගන්නේ
දෙනෙත් පුරා පිරි කඳුලු සලන්නේ)//
හදවත් ගැහෙනා රිද්මය අතරේ
සිතින් ගතින් එක්තැන් වී ඉන්නම්

(කවුරුන්ද ඔබ මගේ - කවුරුන්ද මා ඔබේ)//

(ප්‍රේමය ගොළුවී හඬා වැටීලා
ඔබ හද මා හද රිදවන මොහොතේ)//
ජීවිතයට හුරු පැරදුම හමුවේ
නොදොඩා ගොළුවී බලා සිටින්නම්

(කවුරුන්ද ඔබ මගේ - කවුරුන්ද මා ඔබේ)//

x

071 - මිහිකත නලවාලා - සුනිල් ශාන්ත

මිහිකත නලවාලා මගමල් ගන්වාලා
පාසල වෙතැ යන මේ - පිටිසර හෙළ ගුරු ලි-ය- සැ-ර-දේ ....

සුදු හෙළ සාරිය ඇඳලා හැඩකොට ඉගවට රැලි ලෙලවා
දිගු නිල් වරලස පීරා නිසිලෙස මල් ගවසා බැඳලා ...
ගෙලවට මුතු මාලේ දෝතේ වලලු සැලේ
සිරියා සපුරා -  සිරියා පතුරා ය-න- සුර-තල් ලීලා ...

මිහිකත නලවාලා .../

බෝවිටියා හා බාලොලියා හා ඇ වනමල් සපිරී
මේ හුදු පිටිසර හෙල ගම්මානේ ඔබදෝ සීදේවී
කෝකිලයන් නාදේ අන්න නැගී එන්නේ
හුදු හෙළ පිටිසර තුරුණු විනාවිය ඔ-බ-ටයි ඒ- ගීතේ

මිහිකත නලවාලා .../

ඔලු නෙලුම් ඇ නෙක මල් පිබිදී අහෝ විලේ සිරියා
ජයමැ මලක් ඉන් නෙලාගනී ඔව් හා හා කුමටද ඒ
බාල ලියේ ඔබගේ සුහදා හට වෙද ඒ
සුරතලියේ ඔබ හදවත පතුලේ පෙම් මල- කා- සතු දෝ...

මිහිකත නලවාලා .../
x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

072 - පීනමුකෝ කළු ගඟේ - අමරදේව සහ මල්ලිකා

(පීනමුකෝ කළු ගඟේ කිරි බැබලෙන හඳපානේ)//
දෙගොඩ තලා යන වතුරේ - තරඟ නැඟී පෙණ විසිරේ
කිරි බැබලෙන හඳපානේ ...
පීනමුකෝ කළු ගඟේ කිරි බැබලෙන හඳපානේ

සුනිල් දියේ සඳ කැළුම් වැටිලා දිය රැලි හා රඟ දෙන්නේ
සුදට සුදේ සුදු කෙකටිය ගාලක් දිය මතුපිට ලෙල දෙන්නේ
පීනමුකෝ කළු ගඟේ කිරි බැබලෙන හඳපානේ

ඕළු නෙළුම් මල් දෝත පුරාගෙන සුදු ඇඳුමෙන් සැරසීලා
ඉවුර දිගේ සිරි බෝ මලුවට නොවැ මේ මහ පිරිස ඇදෙන්නේ
පීනමුකෝ කළු ගඟේ කිරි බැබලෙන හඳපානේ

බුදු හිමියානන් මෙලෝ දිනූ ඒ පෝය දිනේ සිරි වෙසඟේ
සාදු නාද දෙති මහ සේනාවෝ නිවන් මඟට බසිනා ..
කිරි බැබලෙන හඳපානේ
(පීනමුකෝ කළු ගඟේ කිරි බැබලෙන හඳපානේ)//

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

073 - තොටුපල අයිනේ - වික්ටර් රත්නායක

(තොටුපල අයිනේ .......... කවුද අත වනන්නේ
කවුද අත වනන්නේ තොටුපල අයිනේ)//

හැන්දෑ වරුවේ ඉවුරේ වැටකේ උණ පඳුරේ හෙවනේ
හබල බිදිලා ........
හබල බිදිලා පෙරළුන ඔරුවක සුන්බුන් නෙත දැවටේ
(ඒ දෙස නොබලමි ..)//
තොටුපල අයිනේ කවුද අත වනන්නේ

ආ මග අඳුරේ පෙරමග එගොඩින් තරු යුවලක් ඇවිලේ
ඔරු කඳ ඇතුලේ .........
ඔරු කඳ ඇතුලේ නුපුරුදු සුවඳක් දියමංකඩ විසිරේ
(හෙට මම හිනැහෙමි ..)//
තොටුපල අයිනේ කවුද අත වනන්නේ

තොටුපල අයිනේ .......... කවුද අත වනන්නේ
කවුද අත වනන්නේ තොටුපල අයිනේ

X

# 074 - හිත මිතුරු සුළඟ - වික්ටර් රත්නායක

(හිත මිතුරු සුළඟ ළඟ එන වැහි වලාවට කියන්
අද නොපැමින අන් දිනයක වැසි රැගෙන එන ලෙසින්
දිගු කලෙකින් ඈ මුණගැසේවි හසගනක් ලෙසින්
වැසි වැටුනොත් ඒ සොඳුරු මොහොත අඳුරු වේ සැණින්)//

වීදි පුරා වතුර පිරෙයි හෙමින් හෙමින් මුමුණ මුමුණ ඇවිද යමු කෙසේ
තණ නිල්ලේ ගොහොරු සැදේ
කතා නැතිව අනන්තයට ඉගිල යනු කෙසේ

හිත මිතුරු සුළඟ ... /

අප සමුගත් පසු වසින්න
ගං හෝ වැව් ඉපිල ඉපිල ඉතිර යනතුරා
හෝරා දෙක තුනක් ඉන්න
නෑවිත් වැහි වලා බදේ කඩ ඉමෙන් එහා

හිත මිතුරු සුළඟ ... //

x

075 - හෙමින් සැරේ පියා විදා - සුනිලා අබේසේකර - ටී. එම්.

හෙමින් සැරේ පියා විදා// - සුමුදු සයනේ සිනිඳු ඇතිරිල්ලෙන්
පලා ඇවිත් සිතුම් සියොතුන් - සුමුදු සයනේ සිනිඳු ඇතිරිල්ලෙන්

මලක් නම් එය මලක් වුව මැන
සිනිඳු සුකොමල ... රැවෙන් සරසන
විලක් නම් එය විලක් වුව මැන
නීල ඉඳුවර ... ප්‍රියෙන් උපදින

හෙමින් සැරේ පියා විදා - සුමුදු සයනේ සිනිඳු ඇතිරිල්ලෙන්
පලා ඇවිත් සිතුම් සියොතුන් - සුමුදු සයනේ සිනිඳු ඇතිරිල්ලෙන්

නැවුම් වත්සුණු රොනින් මත්වී
සිහින නිම්නය ... සුපුෂ්පිත වෙයි
සිහින් හඬකින් මහද අමතයි
මුදා හැරදා ... කවුළු සිරියහනේ

හෙමින් සැරේ පියා විදා - සුමුදු සයනේ සිනිඳු ඇතිරිල්ලෙන්
පලා ඇවිත් සිතුම් සියොතුන් - සුමුදු සයනේ සිනිඳු ඇතිරිල්ලෙන්

x

076 - මා බාල කාලේ - සී. ටී. ප්‍රනාන්දු

(මා බාල කාලේ අම්මාගෙ උකුලේ - නැලවුනු තාලේ මට තාම සිහිවේ)//

පෑ ආදරේ මා හොවමින් තුරුල්ලේ - නෑ හීන වුයේ මෑණී මගේ
ඈ දුන් ඔවා මී ගඟුලේ නාමී - මට තාම සිහිවේ ඈගෙ ගීත රාවේ

මා බාල කාලේ අම්මාගෙ උකුලේ
නැලවුනු තාලේ මට තාම සිහිවේ - මා බාල කාලේ

ඉගෙනීම ඔබගේ ධනයයි සිතා - ඉවසීම කරුණාව ගුණ දම් ගොතා
දුරලන්න වංචා මද මාන ඊර්ෂ්‍යා - මේ වාගේ මට ඈ අවවාද දුන්නා

මා බාල කාලේ අම්මාගෙ උකුලේ
නැලවුනු තාලේ මට තාම සිහිවේ - මා බාල කාලේ

මේ පුංචි ලංකාව ඔබගේ පුතේ - ඈ රැක්ම ඇත්තේ පුතුගේ අතේ
නංවාලා ස්නේහේ රට දෑ කෙරෙහි -
රැක ගන්න හැමදා ඈගෙ නම පුතුනේ

මා බාල කාලේ අම්මාගෙ උකුලේ - නැලවුනු තාලේ මට තාම සිහිවේ
පෑ ආදරේ මා හොවමින් තුරුල්ලේ - නෑ හීන වුයේ මෑණී මගේ
ඈ දුන් ඔවා මී ගඟුලේ නාමී - මට තාම සිහිවේ ඈගෙ ගීත රාවේ
මා බාල කාලේ අම්මාගෙ උකුලේ
නැලවුනු තාලේ මට තාම සිහිවේ - මා බාල කාලේ
X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

077 - සැන්දෑ වලාවන් - ක්ලැරන්ස් විජේවර්ධන

(සැන්දෑ වලාවන් පාවුනාවේ
වැල්ලේ මා තනිවූ වෙලේ
ඇය එන්නී දෝ මග එන්නී දෝ
සිතෙහී නම් සැකයක් නැතේ)//

මාගේ සැනසුම ඈ වේ
නිරතුරු හමුවන්නේ කොහෙදෝ යලි
පැතුමන් මාගේ සිඳ බිඳ දාලා
ඉන්නේ ඇයි මිහිරේ

සැන්දෑ වලාවන් ...

ජීවේ පෙරලී ආවේ ඔබමයි මා සිත පිලිගන්නේ
පැතුමන් මාගේ සිඳ බිඳ දාලා
ඉන්නේ ඇයි මිහිරේ ...

සැන්දෑ වලාවන් ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

078 - දිනෙක මේ නදී තීරේ - ක්ලැරන්ස් විජේවර්ධන

(දිනෙක මේ නදී තීරේ දෙනෙත හමුවෙලා
පිපුණු ඔය සිනා දැසේ කඳුළු බොඳ වෙලා)//

(සිහින මාවතේ පාකර පැතුම් බිඳ හෙලා
සිතක වේදනා දී තව සිතක් හිනැහිලා)//

දිනෙක මේ නදී තීරේ දෙනෙත හමුවෙලා
පිපුණු ඔය සිනා දැසේ කඳුළු බොඳ වෙලා

(ඔබට මා එපා වී යන නමුදු වෙන් වෙලා
නොයයි මා පැතූ ඒ රුව සිතින් ගිලිහිලා)//

දිනෙක මේ නදී තීරේ දෙනෙත හමුවෙලා
පිපුණු ඔය සිනා දැසේ කඳුළු බොඳ වෙලා

(සිහින මාවතේ පාකර පැතුම් බිඳ හෙලා
සිතක වේදනා දී තව සිතක් හිනැහිලා)//
(දිනෙක මේ නදී තීරේ දෙනෙත හමුවෙලා
පිපුණු ඔය සිනා දැසේ කඳුළු බොඳ වෙලා)//

x

## 079 - උඩරට නිළිය හැඩ වගේ - ඇනස්ලි මාලේවන

(උඩරට නිළිය හැඩ වගේ
රතැඟිලි ඇගෙ සැලෙන හැටි අගේ
මල් පැණි බොන්නට පොරකන
මීමැසි රංචුව වාගේ
ඇගෙ රතැඟිලි සැලෙන හැටි අගේ ) //

(සිංහල ජාතියට ගරු සරු - ලබා දෙවන උඩරට නිළිය) //
(ඔබෙ සියුමැලි මඳ සිනාව - රන් පැහැ දෙතොලට ඉනාව ) //
ඇගෙ රතැඟිලි සැලෙන හැටි අගේ

උඩරට නිළිය හැඩ වගේ.../

(බෙර පද තාලයට පා තබා - නරඹන්නන් මන් මත් කරලා) //
(සොඳුරු නිළිය අපෙ නාලිය - උඩරටටම හැඩකාරිය) //
ඇගෙ රතැඟිලි සැලෙන හැටි අගේ

උඩරට නිළිය හැඩ වගේ ...//

X

080 - ආදරය නිසා - රුක්මණී දේවී

(ආදරය නිසා හර්දේ බැදෙනා)//
(අපරාදෙ ජීවිත හානි වේ ) //
සැනසීම සොයා නෙත් කඳුලු හලා
(අපරාදෙ ජීවිත හානි වේ )//

හෝ ... ප්‍රේමෙ මායා සිහිනයෙකි...
නින්දේදි පවා හද සෝකදේ ... සෝකදේ
මේ ගැනම සිතා පසුතැවිලි වෙලා
(අපරාදෙ ජීවිත හානි වේ) //

(කුල භේදය හා දන සැම සොයයි ...)//
හොද ජීවිත මල් මෙන් පරවී වැටෙයි ... පරවී වැටෙයි
මේ ලෝකයෙහී පෙම් සැපත පතා
(අපරාදෙ ජීවිත හානි වේ) //

(මේ ජීවිතයේ සැප නෑ අනේ)//
බැදි ප්‍රේමෙ හර්දේ වෙන්වු කලේ...වෙන්වු කලේ
මේ ආදරයේ රස මිහිර සොයා
(අපරාදෙ ජීවිත හානි වේ) ///

x

081 - එන්න මදනලේ - තිලකසිරි ප්‍රනාන්දු

එන්න මදනලේ ගොස් පවසන්න දුක මගේ
යන්නට හැකි ඔබට පමණි සිර ගෙයට ඇගේ
දිවා රැයේ වැලපිලා දෑස ඇගෙ රතු වෙලා
(කියන්නකෝ මගෙ දුක ඇගෙ කණට ලං වෙලා)//
එන්න මදනලේ .... එන්න මදනලේ

ශෝක පණිවිඩය යවන්න ආදරිය සොයා
කාලිදාස කිවිඳු මේඝ දූතයක් කළා
මට කොයින්ද එම වලා ආම් සුලගෙ ඔබ බලා
කියන්නකෝ මගෙ දුක ඇගෙ කණට ලං වෙලා

එන්න මදනලේ.... /

(සංදේශයකින් යවන්න මෙදුක උන් අතේ)//
හංස ගිරා ලිහිණි කොවුල් කොබෙයියන් නැතේ
සුලගේ මා අසරණයි මට ඇති වස්තුව ඇයයි
(කීවොත් මගෙ දුක සදහට ඔබට මා ණයයි)//

එන්න මදනලේ ..../

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

082 - වරදක් කළත් - සනත් නන්දසිරි

(වරදක් කලත් සිතකින් නොවේ
රිදවන්නේ පලිගන්නේ ඇයි
ඔබමෙන් ඇයත් ඇයමෙන් ඔබත්
මට මාගේ ඇස් දෙක වගෙයි ...)//

(ඔබෙගිනි නිවා ඇගේ හිත දවා අප
එක්වෙලා කුමටදෝ ...)//
වෙනසක් නොවී මගේ හිස් අතින්
පිසලන්නේ කොයි කඳුලු දෝ

වරදක් කලත් .../

(අසරණ ඔබයි තනිවුනු ඇයයි
මට ශාප කර යාවි දෝ ..)//
ඔබ ලෝකයෙන් ඇගෙ ලෝකයෙන්
සමුගන්න සිදුවේවිදෝ ...

වරදක් කලත් ... //

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 083 - අඩු කුලේ කියාලා - ඒ. ජේ. කරීම්

(අඩු කුලේ කියාලා අසරණයා මැඩලන්නෙ මෙලෝකේ වසලයා
වංසේ කුල බේදේ නී ලොවේ නොම වේ බමුණා හෝ වසලයා)//

(පුහු මානය හරදේ පුරවන්නේ
දස පාප ක්‍රියාවේ පැටලෙන්නේ)//
යුතුකම් සුසිරි මග නොම දන්නේ
ඔහු නොවෙද මෙලෝකේ වසලයා
වංසේ කුල බේදේ නී ලොවේ
නොම වේ බමුණා හෝ වසලයා

අඩු කුලේ ... /

(එක ලේ මස් නහරින් බැඳුනු තදේ
මුළු ජීවිත කාලේ විදින වදේ)//
අවසානයේදී මරු සමග ඇදේ
මෙය නොදැන සිටින්නේ වසලයා ..
වංසේ කුල බේදේ නී ලොවේ
නොම වේ බමුණා හෝ වසලයා

අඩු කුලේ ... /

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

084 - පෙම් මල් මාලා - රුක්මණී දේවී

(පෙම් මල් මාලා නෙලා ගොතාලා)// - ප්‍රේමෙ ප්‍රේමේ විනෝදේ පාලා
වීර ඔබගේ ගෙලේ දමාලා - ප්‍රේමෙ ප්‍රේමේ විනෝදේ පාලා

ආලය මෝරා කුසුමේ නැවී - බෝ කල් වුවා මා මනමාලී
රාජිණී- සුවිනීත බාරී - රාජිණී යස මා හැඩකාරී
සොයාලා ආවේ මේ මනමාලී - ප්‍රේමෙ ප්‍රේමේ විනෝදේ පාලා
පෙම් මල් මාලා නෙලා ගොතාලා - ප්‍රේමෙ ප්‍රේමේ විනෝදේ පාලා

(ඔබේ රූපේහී ඡායා ඇඳුනීය හරදේ)//
(කුසුමා ඔබේමයි මාගේ රජින්දේ)//
(පියඹා ආවා ප්‍රේම කුරුල්ලා ස්වප්න පුරේහී කූඩු තනන්ටා)//
මහ බඹා යස පාර කියාලා ප්‍රේමෙ ප්‍රේමේ විනෝදේ පාලා...
පෙම් මල් මාලා නෙලා ගොතාලා - ප්‍රේමෙ ප්‍රේමේ විනෝදේ පාලා

රිදී කුමාරී අහසෙහි පාවී - කෝමල ප්‍රීති පතා වී ආසී
ඔබවේ මාගේ සිරිකත කුසුමා - මා ඔබේ මැයි නෑ සැක පැතුමා
නැගේ ප්‍රබෝදේ මෝරා මෝරා - ප්‍රේමෙ ප්‍රේමේ විනෝදේ පාලා
පෙම් මල් මාලා නෙලා ගොතාලා - ප්‍රේමෙ ප්‍රේමේ විනෝදේ පාලා

x

## 085 - මුණි නන්දන සිරිපාද - ශ්‍රේටා පෙනට්

මුණි නන්දන සිරිපාද වදිම් සමනල කන්දේ විහිදෙන මෝක්ෂ
සුගන්දේ// මුණි නන්දන සිරිපාද වදිම් ශ්‍රී ...
ශාන්ති කරුණා ගුණ ආනන්දේ වැදීලා කරුණා ගුණ ආනන්දේ
පිහිටෙන් සුමන සුරින්දේ සිතූ පැහැදී
මුණි නන්දන සිරිපාද වදිම් සමනල කන්දේ විහිදෙන මෝක්ෂ සුගන්දේ
මුණි නන්දන සිරිපාද වදිම් ශ්‍රී ...
ලිහිනි හෙලේ අම්බලමේ සින්දලා ගිමන් //
ධර්මරාජ ගලේ නැගී ගල්පඩි ගනිමින් //
තුන් සරණේ පිහිට පතාලා සන්තොසිනේ ඉන් පිටත් වෙලා
පිහිටෙන් සුමන සුරින්දේ සිතූ පැහැදී-මුණි නන්දන සිරිපාද වදිම් ..
ගෙත්තම් කර සිරිත ලෙසින ගෙත්තම් පානේ
සීත ගඟුලේ නාලා සැම පඬුරු බැඳගෙනේ
ගෙත්තම් කර සිරිත ලෙසින ගෙත්තම් පානේ
මළුව පෙනෙයි යමු නැවතී හැරමිටි පානේ
සමන් දෙවි කරුණාවයි නඩේ සැමටම සැපවෙයි//
පිහිටෙන් සුමන සුරින්දේ සිතූ පැහැදී-මුණි නන්දන සිරිපාද වදිම් ...
ඇහැල කනුව ලඟ නැවතී පිරුවට ඇඳලා//
අහස් ගව්ව පසු කරමින් සාධු කියාලා//
මහ- මලුවට විත් ගිරිදඹ නැගලා - සිරි- පතුල වදිමු නිවන් පතාලා
එමපින් සමන් සුරිඳුටත් පමුණාලා
මුණි නන්දන සිරිපාද වදිම් සමනල කන්දේ විහිදෙන මෝක්ෂ සුගන්දේ
මුණි නන්දන සිරිපාද වදිම් ශ්‍රී ...

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 086 - සැළලිහිණි කොවුල් - සී. ටී. සහ ලතා

සැළලිහිණි කොවුල් හඬ රැව් දෙන්නා
මහ උයනක සිරි ඉතිරේ
මුව රැල අතරේ වග වලසුන්ගේ
රඟ මඩලකි මේ උයනේ

(නීල කොබෝ රෑන ගිරා පිල් විදහා රඟනා මොණරා)//
(කට ඇද කිරලා සහ වලි කුකුළා හොට දිග පිලිහුඩුවා)//

අප දැකලා බිය වැදිලා තරඟෙට හඬ නැගුවා

සැළලිහිණි කොවුල් ...

(කොළ දිවියා රළු කොටියා කපටි රජා නම් ළද හිවලා)//
(විෂ කුරු පොළඟා මිනි කන කිඹුලා පොතු හැර කබරගොයා)//

රට පිඹුරා ළඟම නයා දරණ ගසා සිටියා

සැළලිහිණි කොවුල් ...

X



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 087 - ඉරට මුවාවෙන් ඉඳගෙන - අමරදේව

ඉරට මුවාවෙන් ඉඳගෙන හිස පීරනවා
සඳට මුවාවෙන් ඉඳගෙන සළු පලඳිනවා
දීප චන්ද්‍ර රේඛාවෙන් මුහුණ බලනවා
වළාකුලෙන් අහස් තලෙන් බිමට වඩිනවා

(පායන තරු ඇස් ඇරලා බලා සිටිනවා) //
පීදෙන මල් පෙති විදහා මුකුළු කරනවා
සුළං රොදින් ඇදී ඇවිත් ඇගේ වෙලෙනවා
ගහ කොළ සෙලවෙන තාලෙට රහස් කියනවා

(මේඝ මැදින් විදුලිය මෙන් නටා දිවෙනවා) //
සීතල පොද වරුසාවෙන් සුසුම් හෙළනවා
ඇල දොල ගං ඇද හැලිලා ගිමන් නිවෙනවා
මගේ හදට සදා සතුට ඔබෙන් ලැබෙනවා

ඉරට මුවාවෙන් ඉඳගෙන හිස පීරනවා
සඳට මුවාවෙන් ඉඳගෙන සළු පලඳිනවා
දීප චන්ද්‍ර රේඛාවෙන් මුහුණ බලනවා
වළාකුලෙන් අහස් තලෙන් බිමට වඩිනවා

X

088 - රන් දෑහඬිය බිංදූ බිංදූ - අමරදේව

(රන් දෑහඬිය බින්දූ බින්දූ
ඉසුරු සුවඳ රැන්දූ රැන්දූ)//
ගතිනි හලා ගයමු
(රන් ගොයමේ සින්දූ සින්දූ)//

(දෑතේ රන් වළලු දගේ
ගෙල බැඳි රන් මාල අගේ
රන් ගොයමේ නෙළන ලදේ
සිරියාවයි රටට මගේ)//

(නෙළුම් කෙතේ ලන්දූ ලන්දූ
සොඳුරු කිඳුරු ළන්දූ ළන්දූ)//
දෙව් පිහිටෙන් ගයමු
(රන් ගොයමේ සින්දූ සින්දූ)//

(බුලතේ රත දූවිම් තොලේ
මට නොවෙදෝ මුකුලු කලේ
රන් ගොයමේ නෙළන කලේ
මන බැඳුනා පබලු වැලේ)//

රන් දෑහඬිය ...

x

089 - ඔබේ අත ගෙන - රෝහණ සිරිවර්ධන

(ඔබේ අත ගෙන පෙර සැඳෑවක
උයන් තෙර හිඳ ආදරෙන්
ගැයූ කුළුඳුල් ප්‍රේම ගීතය
විරහ ගීයක් නොවේවා) //

(ඔබේ හදවත සැලෙන රාවය
පවා මසිතට දැනුණු මොහොතක) //
හදවතින් තෙපලූ කතා
කිසිදු දිනයක ගොළු නොවේවා

ඔබේ අත ගෙන ... /

(ඔබේ සිහිලැල් සුවැති සෙවනේ
රැඳි අප උන් ඒ සැඳෑවේ)//
හදවතින් මතුවූ සිනා
කිසිදු දිනයක බොඳ නොවේවා

ඔබේ අත ගෙන ... //

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 090 - යමුණා ගං තෙර - නන්දා මාලිනී

යමුණා ගං තෙර තමළු ලතා හෙවනේ
යොහොඹු කුසුම් යහනේ
රාධා බලා ඉඳී
ක්‍රිෂ්ණා.. ක්‍රිෂ්ණා.. ක්‍රිෂ්ණා

නලලත බබලන සඳන තලාවයි
සිරුරට ඝන නිල් මේඝ වලාවයි
මානස විල මැද රණ තිසරාණනි
වෘන්දා වනයේ වසන්තයයි
ක්‍රිෂ්ණා.. ක්‍රිෂ්ණා.. ක්‍රිෂ්ණා

මලය ගිරේ මධු ගීත කලාවයි
තෙබුවන රැකුමේ ඉසිඹු වෙලාවයි
වන රේබාවේ රණ මොනරාණෙනි
තරුද නොපායන රාත්‍රියයි
ක්‍රිෂ්ණා.. ක්‍රිෂ්ණා.. ක්‍රිෂ්ණා

යමුණා ගං තෙර...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

## 091 - කඳුළු කථාවේ - අමරදේව

(කඳුළු කථාවේ නිමක් දුටුව දා
සිහින ලතාවේ මලක් පිපුන දා)//
සතුටු ගඟක් ගැලුවා
හදට හදක් බැඳුනා

(ආසිරි චාමර පවන් සැලී
සෝ දුක් සංකා සෙමින් මැකී)//
දෙගුරුන් මිතුරන් සුපැතුම් මැද්දේ
අපේම ලොව අපි තනිවුවේ

කඳුළු කථාවේ ...

(සුසුමක පාකර හසුන් යවා
දෙතැනක තනිවී හඬා දොඩා)//
ගෙවුනු අතීතෙන් අප සමුගන්නෙමු
අලුත් ලොවක රන් කිරුළු දරා

කඳුළු කථාවේ ...

X

092 - පාළු අඳුරු නිල් අහස - අමරදේව

පාළු අඳුරු නිල් අහස මමයි
ඈත දිලෙන තනි තරුව ඇයයි
යුගයෙන් යුගයට හදවත් ඉල්ලන
බලාපොරොත්තුව පැතුම ඇයයි
පාළු අඳුරු නිල් අහස මමයි
ඈත දිලෙන තනි තරුව ඇයයි

(අසාර වූ මහ පොළව ඇයයි ගලා බසින දිය දහර ඇයයි)//
යුගයෙන් යුගයට හදවත් නලවන සදාකාලිකවූ පැතුම ඇයයි
පාළු අඳුරු නිල් අහස මමයි
ඈත දිලෙන තනි තරුව ඇයයි

(කැලෑව මැද කටු පඳුර මමයි පිපී වැනෙන මල් පොකුර ඇයයි)//
යුගයෙන් යුගයට හදවත් පුරවන අඳුරු වේදනා කැටිය ඇයයි
පාළු අඳුරු නිල් අහස මමයි
ඈත දිලෙන තනි තරුව ඇයයි

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

093 - ආජු තපර - දීපිකා ප්‍රියදර්ශණී

(මහා මෙරක් ලෙසට හිතේ උපන් බරට
හඬා දොඩා පල නොලබන හින්දා
උදා ලහිරු විලස එබී ඉදිමු ලොවට
සිනා මලක් මුව අද්දර රන්දා) //

විදු නැණයෙන් අබිසෙස් ලබමින්නේ
සඳ මතුපිට පියවර එසවෙන්නේ
අප පමණද එක තැන කැරකෙන්නේ
අප තනිකර ලෝකය දිව යන්නේ
(ආජු තපර ලාහිලා බීජි තපර ලාහිලා
ආජු තපර බීජි තපර බිස්කු බිස්කු ලාහිලා) //

අපේ හදට සතුටක් මුසුවේ නම්
අපේ දුකට සුසුමක් මතුවේ නම්
අපේ හිතට දිරියක් ලැබදේ නම්
එදා අපට පෙරමග සුදානම්
(ආජු තපර ලාහිලා බීජි තපර ලාහිලා
ආජු තපර බීජි තපර බිස්කු බිස්කු ලාහිලා) //

x

094 - පිනිබර යාමේ - සුනිල් එදිරිසිංහ

පිනිබර යාමේ සැවුළන් අඬලනවා
අම්මා වටකොට ලිප ගිනි මෙලවෙනවා
කොළඹ රේල්ලුව රජ ගමනින් එනවා
නැගිටින් පුතුනේ බිම්මල් හිනැහෙනවා

(පුතුනේ අකුරට යන්න පමාවී
ගුරුසිත රිදිලා වේවැල හඬවාවී) //
ගගේ ඇලේ පැන තෙප්පම් පැදලා
මුරංඩු වූදා - දුක් වේවී අම්මා

පිනිබර යාමේ ...

(වේල දෙවේලේ කුසගිනි නොබලා
කඩමළු ඇන්දත් පින්කඳ බැබලෙනවා) //
කලට රුවන් වැසි වස්සන තාලේ
ශිල්ප උගත් දා - නුඹ සක්විති වෙනවා

පිනිබර යාමේ ...

x

095 - සඳකඩ පහනක - සුනිල් එදිරිසිංහ

සඳකඩ පහනක කැටයම් ඔපලා පාවෙන දේදුනු ලැගුම් ගනී
කැලැතුනු රසයක පැන ආ බුබුලක් අකුරු වැලක් දෙහදක ලියවේ
යුගයෙන් යුගයට නොමියෙන දහනක දිවියක පදනම මතුවෙද්දී
නොපෙනෙන ඈතක ඈ ගෙන යනවා (සියුමැලි කැකුලක් මැලවෙද්දී)//

දහසක් පෙති මත රහසක් කොඳුරා තුඩින් තුඩට ගෙනයන බිංදු
ගව්වක් ඉහලට ගොනුකොට රඳවා පොපියන දෙතොලක් එහි කැංදු
අහසක් ගුගුරා සළුවක් වපුරා ඒ හා මුහුවුනු වැහි බිංදු
ඈ ගෙන යද්දී නටබුන් අතරට (තවෙකෙක් ඈ වෙත හද රැංදු)//

සඳකඩ පහනක ...

හදවිල ඉපැදුනු කැකුලක් නොකලක නටුවෙන් ගලවා දුරක යවා
මිහිලිය තෙත්කොට ගිලිහුණු කඳුලක් සත් සමුදුරකට මුහුව ගියා
ඔබට උරුම වූ රිදුනු තැවුනු හද එක් ටැම් මැදුරක කවුළු අරා
රුවන් විමානෙන් පියඹා එනතුරු (පොපියන හදවත සිටී බලා) //
සිටී බලා......

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

096 - මී අඹ වනයේ - සී. ටී. ප්‍රනාන්දු

මී අඹ වනයේ ගී හඬ පතුරා කාවද අමතන්නේ
ලස්සන මුහුණට ඇස්වහ දෙන්නද ඔය හැටි හිනැහෙන්නේ
මිහිබට දෙවඟන ඇවිදින තාලෙට කොහොමද ඇවිදින්නේ
ලා නිල් පාටට දිලිසෙන හින්දද ඇස් දෙක නලවන්නේ

සිහිනෙන් සිහිනෙට ඔබ එනවා
මොනවද හෙම්හිට මුමුනනවා
හදවත රිදුමද නවතිනවා
මොහොතින් යළි නොපෙනී යනවා

බඳ වට සුදු ඔසරිය ඇඳලා
මල් පොකුරක් ඔබ අත තබලා
ලඟදිම මනමාලිය කරලා
ගෙනයන්නෙමි ඔබ මගෙ කියලා

මී අඹ වනයේ ගී හඬ …

X

# MadhuraGeet

Touch through music

097 - මී වදයකී ජීවිතේ - සී. ටී. ප්‍රනාන්දු

මී වදයකී ජීවිතේ මී පැණි පිරිලා ඇතේ
මත් වීලා ගුම් ගුම් නද දීලා සැනසෙමු අපි හිතු මතේ
මලින් මලට පියඹමු - තුඩින් තුඩට රොන් ගමු
ලියන් තමා රස ඉහිරෙන මල් වැල් - ඔවුන් සොයාගෙන යමු ..

හිරු නාවාදෙන් සඳ ගිලුනාදෙන් ඉන්නා ටික කාලේදී
රසට රසක් වී මිහිරට එක්වී අපිවෙමු මීමැසි පොදී
(මී මැස්සෝ ඔබයි මමයි - මීමැස්සියෝ ළඳුන් තමයි)//
මී වදයකී ජීවිතේ මී පැණි පිරිලා ඇතේ
මත් වීලා ගුම් ගුම් නද දීලා සැනසෙමු අපි හිතු මතේ

ලස්සන දේ ගැන ඇස් ඇදිලා යයි සිරිබර විසිතුරු ලොවේ
දකින දැකුම් සිත වසඟ කරාලයි දෑසට දී රස සුවේ
(සන්තෝසෙයි දුකයි සැපයි - සාදා දෙන්නේ අපේ සිතයි)//

මී වදයකී ජීවිතේ මී පැණි පිරිලා ඇතේ
මත් වීලා ගුම් ගුම් නද දීලා සැනසෙමු අපි හිතු මතේ
මලින් මලට පියඹමු - තුඩින් තුඩට රොන් ගමු
ලියන් තමා රස ඉහිරෙන මල් වැල් - ඔවුන් සොයාගෙන යමු ..

x

## 098 - මම ගන්නෙමී කරකාර - ජෝතිපාල

(මම ගන්නෙමී කරකාර බන්දාලා පුංචි හාමිනේ වලව්වෙන් දැන්
මම ඉන්නෙමී මහරාජා වාගෙ මේ ගමේ කාටත් උදව් කරමින්)//

වලව්වෙ හාමුට කියනව මං පුංචි හාමුයි මගෙ මනමාලී //
පුල්ලි ගොනා බැඳි බරබාගෙන් මම ගෙදරට කැන්දන් එමී //
මම එහෙම එනකොට පාර දිගේ මගෙ යාලුවෝ එකතුවෙලා
මල් ඉහලා - ගී කියලා - බෙර ගහලා - අපි දෙන්නාව
පිලිගන්නේ මඟ ඉඳලා

මම ගන්නෙමී ...

ඉස්සර මං වාගෙ උදවියටයි රජ කුමරියො ආලෙ කලේ //
දැන් කාලේ මේ වාගෙ බැරි ඇයිදෝ
මට යතුරක් දීලයි ගියේ //
මගෙ යාලුවෝ ඔක්කොම මනමාලි එක්කල නග්ගල බරබාගේ
මම එන්නම් - ඇය කැන්දන් -
මගෙ මාස්ටර් - බලන්නට - රජ පෙරහැර වාගේ

මම ගන්නෙමී ...

x



Compiled by Chandra B. Gamlath
http://www.madhurageet.com

099 - [පෘතුගීසි කාරයා] - ජෝතිපාල

(පෘතුගීසි කාරයා රටවල් අල්ලන්න සූරයා
හතුරෑ රාජ මාරයා මුලු ලෝ හොල්ලන්න වීරයා)//
(කොළඹට ආවේ ඉඳලයි ලිස්බන් නගරේ
අපි ආ පාරේ පැතිරේ විනෝද මිහිරේ) // පැතිරේ විනෝද මිහිරේ //
විනෝද මිහිරේ... පෘතුගීසි කාරයා රටවල් අල්ලන්න සූරයා
හතුරෑ රාජ මාරයා මුලු ලෝ හොල්ලන්න වීරයා

(අපේ තුවක්කු ඉහලම කාලතුවක්කු
ගහන්න වෙනවා වැදුනොත් ලෝකෙට මුක්කු)//
(වැදුනොත් ලෝකෙට මුක්කු)//
විනෝද මිහිරේ...පෘතුගීසි කාරයා ...

(කන්න හපන්නු බොන්නත් බොහොම හපන්නු
ඊටත් වැඩියෙන් යුද්ධෙට හරිම හපන්නු)//
(යුද්ධෙට හරිම හපන්නු) // විනෝද මිහිරේ ... පෘතුගීසි කාරයා ...

(එක උගන්වන්න තමයි යුද්ධ කරන්නේ
කාලතුවක්කුයි බයිනෙත්තුයි හරඹන්නේ)//
(බයිනෙත්තුයි හරඹන්නේ) // විනෝද මිහිරේ ...පෘතුගීසි කාරයා ...

(වයින් බෝතලේ ඇති තැන විනෝද මිහිරේ
වැඩියෙන් ගත්තොත් යා හැකි දෙව්ලොව පාරේ)//
(යා හැකි දෙව්ලොව පාරේ) //විනෝද මිහිරේ ... පෘතුගීසි කාරයා ...
x

100 - කොල කඩ කඩ බොරුවට - ජෝතිපාල

(කොල කඩ කඩ බොරුවට දෙනවා)// ඕ ...
කොල කඩ කඩ බොරුවට දෙනවා මම ගහ හොඳ හැටි අඳුනනවා
අපට බොරු චාටු එපා .. // පිරිමින්ගෙ ...

එක මකුණයි ලමයෝ කන්නේ ඇයි ඔක්කොම මකුණො මරන්නේ
මොකද අඩුපාඩු මගේ// සුදූ කෙල්ලේ
ඕ ....(මම ඕන වැඩක් කර දෙන්නම්) // ඕ .....
මම ඕන වැඩක් කර දෙන්නම් අලි ඇත්තු උනත් පෙරලන්නම්
ඔබට ආඩම්බරනේ .. // කලු මැණිකේ ..

මට බැරිය මිරිස් අඹරන්ටා //
උදව් දෙනවාද අනේ // බෑ නොකියා ..
ඕ ....(පොල් කඩලා ගාලා දෙන්නම්) // ඕ .....
පොල් කඩලා ගාලා දෙන්නම් රෙදි සෝදා වේලා දෙන්නම්
මොකද ආදරෙද පනේ .. // දැන් හරිනේ..

තව හිතල බලන්නට ඕනේ //
මෙහෙම වැඩ එහෙම හොදේ ... හරි නැනේ...

x